# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 2,157 - 2020 ජනවාරි මස 03 වැනි සිකුරාදා - 2020.01.03

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස : (IIආ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත)


| | පිටුව |
|---|---|
| ටෙන්ඩර් කැඳවීමේ දැන්වීම් .... ... ... | — |
| තීරණය කළ ටෙන්ඩර් පත් පිළිබඳ දැන්වීම් ... ... ... | — |
| බඩු බාහිරාදිය විකිණීම් ... ... ... | 22 |
| තොටුපල් රේන්ද හා වෙනත් රේන්ද විකිණීම් ... ... ... | — |
| රජයේ නොවන දැන්වීම් ... ... ... | 26 |
| රට බීම විකිණීමේ බලපත්‍රය සඳහා වූ අයදුම්පත් ... ... | — |
| වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම් ... ... ... | 31 |


*සැ. යු.* - විවාහ (සාමාන්‍ය) (සංශෝධන) පනත් කෙටුම්පත 2019 දෙසැම්බර් මස 20 වැනි දින *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ* II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළකරන ලදී.

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

### වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයක ම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතු ය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට **තෙමසකට** පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළකරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනට සති දෙකකට පෙර (එනම්, 2020 ජනවාරි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2020 ජනවාරි මස 09 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර) තැපෑලෙන් හෝ ගෙනැවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතු ය.

**2006 අංක 19 දරන ඉලෙක්ට්‍රොනික ගණුදෙනු පනත - 9 වැනි වගන්තිය**

*" යම් ප්‍රකාශනයක්, රීතියක්, නියෝගයක්, නියමයක්, අතුරු ව්‍යවස්ථාවක්, නිවේදනයක් හෝ වෙනත් කිසිවක් ගැසට් පත්‍රයේ පළකළ යුතු බවට යම් පනතකින් හෝ නීති ප්‍රඥප්තියකින් විධිවිධාන සලස්වා ඇති අවස්ථාවක, ඒ රීතිය, නියෝගය, නියමය, අතුරු ව්‍යවස්ථාව, නිවේදනය හෝ වෙනත් දෙය ඉලෙක්ට්‍රොනික ස්වරූපයේ වන ගැසට් පත්‍රයක පළකරනු ලැබුවහොත් ඒ විධිවිධානය සම්පූර්ණකර ඇත්තාක් සේ සැලකිය යුතුය."*

**ගංගානි ලියනගේ,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2020 ජනවාරි මස 01 වැනි දින,
කොළඹ 08,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ දී ය.

*මෙම ගැසට් පත්‍රය www. documents.gov. lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

# බඩු බාහිරාදිය විකිණීම්

## මහෙස්ත්‍රාත් අධිකරණය - බලපිටිය

අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා පවතින නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

01.බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩුවලට අදාළව රාජසන්තක කරනු ලැබූ හා පවතින පහත සඳහන් වැලි හා පස් 2020.01.08 වැනි දින පෙ. ව. 10.00ට බලපිටිය අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

02. මෙහි සඳහන් වන වැලි හා පස් සම්බන්ධයෙන් හිමිකම් පාන්නෙකු වේනම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දින වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර හිමිකම් ඉදිරිපත් කළ යුතු අතර ඒ පිළිබඳ සලකා බැලීම සඳහා අදාළ වැලි හා පස් වෙන්දේසියෙන් ඉවත් කරනු ලැබේ.

03. අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2කට පෙර වෙන්දේසියේ නියමිත වැලි හා පස් මහජනතාවට පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි එම වැලි හා පස් වෙන්දේසියෙන් ඉවත් කිරීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන වැලි හා පස් භාර ගැනීමේදී හා මුදල් ගෙවීමේදී තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු අතර හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්ය වේ.

06. සියලු ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, මිලදී ගන්නා වැලි හා පස් වෙන්දේසිය පවත්වන දිනයේම ප. ව. 4.00ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය.

සම්පත් එන්. ගමගේ,
මහෙස්ත්‍රාත්/අතිරේක දිසා විනිසුරු,
මහෙස්ත්‍රාත් අධිකරණය,
බලපිටිය.

2019 දෙසැම්බර් මස 13 වැනි දින,
බලපිටිය මහෙස්ත්‍රාත් අධිකරණයේ දීය.

### වෙන්දේසි කිරීමට නියමිත වැලි හා පස්

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩය |
|---|---|---|
| 01. | 25474 | පස් කියුබ් 01 |
| 02. | 25780 | පස් කියුබ් 01 |
| 03. | 25965 | පස් කියුබ් 01 |
| 04. | 25960 | පස් කියුබ් 01 |
| 05. | 26129 | පස් කියුබ් 01 |
| 06. | 26630 | පස් කියුබ් 01 |
| 07. | 25395 | පස් කියුබ් 01 |
| 08. | 8355 | පස් කියුබ් 01 |
| 09. | 20325 | වැලි කියුබ් 01 |

01-216

## උඩුගම දිසා මහෙස්ත්‍රාත් අධිකරණය

01. උඩුගම දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ නඩු භාණ්ඩ වශයෙන් ඇති රාජසන්තක කරන ලද හා මෙතෙක් හිමිකම් පෑමක් නොකළ පහත සඳහන් භාණ්ඩ 2020.01.18 වෙනි සෙනසුරාදා පෙ.ව. 9.30 අධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ දී විකුණනු ලැබේ.

02. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් සඳහා හිමිකම් දක්වන්නකු වේ නම්, වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකිය අයිතිවාසිකම් ඉදිරිපත් කළ යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය මත එදින වෙන්දේසිය පැවැත්වීමට පෙර භාණ්ඩ පරීක්ෂා කළ හැකිය.

04. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලන්සුව නොපිළිගැනෙන අවස්ථාවන්හිදී අධිකරණයේ අභිමතය පරිදි ද්‍රව්‍යයන් වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ පූර්ණ අයිතිය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියේ දී මිලදී ගනු ලබන ද්‍රව්‍යයන් සඳහා එවෙලේම මුදල් ගෙවා එකී භාණ්ඩ අධිකරණ භූමියෙන් එදිනම ඉවත් කර ගත යුතු අතර, චෙක්පත් භාරගනු නොලැබේ.

06. භාණ්ඩ ගැනුම්කරුවන් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත රැගෙන ආ යුතුය.

සංජය එල්. එම්. විජේසිංහ,
දිසා විනිසුරු/මහෙස්ත්‍රාත්,
දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය,
උඩුගම.

2019 දෙසැම්බර් මස 09 වැනි දින,
උඩුගම දිසා මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව

| අනු. අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 01 | 07537 | ටේලරය සහිත අත් ට්‍රැක්ටර් 01 |
| 02 | අංක රහිත | අබලි දිරා පත් වී ඇති යතුරුපැදිය |
| 03 | අංක රහිත | අබලි දිරා පත්වී ඇති යතුරු පැදිය |
| 04 | අංක රහිත | අබලි දිරා පත් වී ඇති යතුරුපැදිය |
| 05 | අංක රහිත | අබලි දිරාපත්වී ඇති යතුරු පැදිය |
| 06 | අංක රහිත | අබලි දිරා පත්වී ඇති යතුරු පැදිය |
| 07 | AR346/13 | 158-9360 දරන යතුරු පැදිය |
| 08 | අංක රහිත | යතුරුපැදි 01 |
| 09 | 08742 | සවල් 01 |
| 10 | 09260 | සවල් 01 |
| 11 | 08751 | උදළු 01 |
| 12 | 08827 | උදළු 01 |

| අනු අංකය | නඩු අංකය | භාණ්ඩ විස්තරය |
|---|---|---|
| 13 | 08828 | උදළු 01 |
| 14 | 08967 | උදළු 01 |
| 15 | 08968 | අත් පොරව 01 |
| 16 | 07537 | යකඩ ඉනිමං හැඩයේ තට්ටු 01 |
| 17 | 7001 | හෝස් 01 |
| 18 | AR 506/19 | කුඩ 03 |
| 19 | 04/05 | සවල් 01 |
| 20 | 04100 | සවල් 01 |
| 21 | 04098 | සවල් 01 |
| 22 | 04097 | සවල් 01 |
| 23 | 04107 | සවල් 01 |
| 24 | 04106 | සවල් 01 |
| 25 | 04104 | සවල් 01 |
| 26 | 04103 | සවල් 01 |
| 27 | 04102 | සවල්01 |
| 28 | 04101 | සවල් 01 |
| 29 | 04096 | සවල් 01 |
| 30 | 04108 | සවල් 01 |
| 31 | | භාණ්ඩ සමීක්ෂණයෙන් ඉවත් කරන ලද ඇඳිසහිත ලී පුටු 02 යි |

01-03

---

**මහාධිකරණය - පුත්තලම**

**අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා හිමිකම් නොකියන ලද වාහන ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

පුත්තලම මහාධිකරණයේ පවරනලද නඩුවලට රාජසන්තක කරන ලද පහත සඳහන් රථය 2020 ජනවාරි මස 30 බ්‍රහස්පතින්දා පෙ.ව. 9.00 ට පුත්තලම මහාධිකරණ භූමියේදී ප්‍රසිද්ධ වෙන්දේසියේදී විකුණනු ලැබේ ෑ

02. මෙම රථය සම්බන්ධයෙන් හිමිකම් දක්වන්නේ නම් වෙන්දේසි පවත්වන දිනයේ දී වෙන්දේසිය පැවැත්වීමට පැයකටවත් කලින් රෙජිස්ට්‍රාර්වරයා වෙත හිමිකම් ඉදිරිපත් කල යුතුය.

03. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරිමට පැයකට පෙර වෙන්දේසියේ විකිණීමට සූදානම් කර ඇති රථය පරීක්ෂා කර බැලිය හැක.

04. අධිකරණය විසින් නියම කරනු ලබන අවම ලංසුව නොපිළිගන්නා අවස්ථාවන්හි දී අධිකරණයේ අභිමතය පරිදි එම රථය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ බලය අධිකරණය සතුව පවතී.

05. වෙන්දේසියෙන් මිලදී ගන්නා එකී රථය සඳහා එම අවස්ථාවේදීම මුදල් ගෙවා අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතු ය. සියළුම ගෙවීම් මුදලින් ගෙවිය යුතු අතර, චෙක්පත් හා මුදල් ඇණවුම් භාරගනු නොලැබේ.

06. එකී රථය මිලදී ගත් අය තම ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කිරීම අනිවාර්යය වන අතර, මිලදී ගන්නා එම රථය එදිනම පස්වරු 4.00 ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

කේ. ඩී. එල්. එස්. කුමාර,
මහාධිකරණ විනිසුරු,
පුත්තලම.

2019 දෙසැම්බර් මස 09 වැනි දින,
පුත්තලම මහාධිකරණයේ දී ය.

| අනු අංකය | නඩු අංකය | ලි. ප. අංකය | චැසි අංකය | එන්ජින් අංකය | විස්තරය |
|---|---|---|---|---|---|
| 01. | HC 46/2018 | NWPX - 9187 | MA1ZP2TAKE1C28435 | TAE 1C 61213 | මහෙන්ද්‍රා B. M. T. Plus-VX ද්විත්ව කාර්ය රථය. |

01-02

## මහෙස්ත්‍රාත් අධිකරණය - බද්දේගම

### මෙම අධිකරණය වෙත ඉදිරිපත් කරන ලද රාජසන්තක කරනු ලැබූ නඩු කටයුතු අවසන් කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

1. බද්දේගම මහෙස්ත්‍රාත් අධිකරණයේ පවරන ලද නඩුවලට අදාළව අධිකරණයට ඉදිරිපත් කරනු ලදුව හා නඩු කටයුතු අවසන් කරන ලද රාජසන්තක කරනු ලැබූ හා මෙතෙක් හිමිකම් නොපාන ලද නඩු භාණ්ඩ 2020.01.15 වැනි දින පෙ. ව. 10.00ට බද්දේගම මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

2. මෙහි පහත සඳහන් භාණ්ඩවල හිමිකම් දක්වන්නෙකු වේ නම් වෙන්දේසිය පැවැත්වීමට නියමිත දිනට පෙර ස්වකීය හිමිකම් ලියවිල්ලක් මගින් අධිකරණයට රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය ඃ

3. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ඇතිව වෙන්දේසියට පැය භාගයකට (1/2) පෙර වෙන්දේසියේ විකිණීමට නියමිත ද්‍රව්‍ය මහජනයාට පරීක්ෂා කර බැලිය හැක.

4. අධිකරණය මගින් නියම කරනු ලබන අවම ලංසුව පිළිනොගැනෙන අවස්ථාවලදී අධිකරණයේ අභිමතය පරිදි මෙම ද්‍රව්‍ය වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුව පවතී.

5. වෙන්දේසියෙන් මිලදී ගනු ලබන භාණ්ඩ සඳහා එවේලේම මුදල් ගෙවා එම භාණ්ඩ අධිකරණ භූමියෙන් ඉවත් කරගත යුතුය. සියලු ගෙවීම් මුදලින් පමණක් කළ යුතුය.

6. ගැණුම්කරුවන් විසින් තමන්ගේ අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා ජාතික හැඳුනුම්පත ඉදිරිපත් කළ යුතු ය.

7. වෙන්දේසිය පිළිබඳ පැමිණිලි අතොත් එම අවස්ථාවේම ඉදිරිපත් කළ යුතු අතර පසුව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි සලකා බලනු නොලැබේ.

ටී. ඒ. ධම්මික හේමපාල,
දිසා විනිසුරු/ මහෙස්ත්‍රාත්,
දිසා මහෙස්ත්‍රාත් අධිකරණය,
බද්දේගම.

2019 දෙසැම්බර් මස 18 වැනි දින,
බද්දේගම දිසා/මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

### වෙන්දේසි භාණ්ඩ ලැයිස්තුව - 2020

දිසා/මහෙස්ත්‍රාත් අධිකරණය - බද්දේගම

| *අනු. අංකය* | *නඩු අංකය* | *භාණ්ඩ විස්තරය* | *ප්‍රමාණය* |
|---|---|---|---|
| 01. | 83643 | අංක SPVT - 4467 දරන BAJAJ PLATINA BLACK යතුරුපැදිය | 01 |
| 02. | AR 796/19 | අංක SPHL-9568 දරන BAJAJ CALIBER 115 වර්ගයේ යතුරුපැදිය | 01 |
| 03. | AR 794/19 | අංක SP TB 7933 දරන BAJAJ CT - 100 යතුරු පැදිය | 01 |
| 04. | AR 806/19 | අංක SPMK - 8821 දරන SUPPER CUSTOM වර්ගයේ යතුරු පැදිය | 01 |
| 05. | AR 844/19 | අංක SPHN - 5720 BAJAJ CALIBER වර්ගයේ යතුරු පැදිය | 01 |
| 06. | 50139 | අංක SPTE - 2425 දරන BAJAJ XCD වර්ගයේ යතුරු පැදිය | 01 |
| 07. | AR 795/19 | අංක SPWD - 2032 දරන HERO HONDA වර්ගයේ යතුරු පැදිය | 01 |
| 08. | AR 805/19 | අංක 130-4715 දරන HONDA සුපර් කබ් වර්ගයේ යතුරු පැදිය | 01 |
| 09. | 2603 | ඉනෝවේස් වර්ගයේ ගුවන් විදුලි යන්ත්‍රය | 01 |
| 10. | 91847 | කොළ පැහැති වයර් කැබැල්ල | 01 |

01-273

**මහෙස්ත්‍රාත් අධිකරණය - බදුල්ල**

**අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලබන භාණ්ඩ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

රාජසන්තක කරන ලද පහත සඳහන් නඩු භාණ්ඩ 2020.01.18 වැනි සෙනසුරාදා දින පෙ.ව. 10.00 සිට බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණ භූමියේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

01. මෙහි පහත සඳහන් කිසියම් භාණ්ඩයක් පිළිබඳ හිමිකම් පාන්නන් සිටී නම් වෙන්දේසිය ආරම්භ කිරීමට පෙර ස්වකීය හිමිකම් අධිකරණයේ රෙජිස්ට්‍රාර් වෙත ලිඛිතව ඉදිරිපත් කළ යුතුය.

02. රෙජිස්ට්‍රාර්වරයාගේ අවසරය ලබා වෙන්දේසිය ආරම්භ කිරීමට පැය 1/2 කට පෙර වෙන්දේසියේ විකිණීමට ඇති භාණ්ඩ පරීක්ෂා කර බැලිය හැකිය. අධිකරණය විසින් නියම කරනු ලබන ලංසුව නොපිළිගැනෙන අවස්ථාවක දී අධිකරණයේ අභිමතය පරිදි මෙම භාණ්ඩ, වෙන්දේසියෙන් ඉවත් කර ගැනීමේ අයිතිය අධිකරණය සතුය.

03. වෙන්දේසියේ භාණ්ඩ මිලදී ගන්නා ගැණුම්කරුවන් තම අනන්‍යතාවය සනාථ කිරීමට ජාතික හැඳුනුම්පත රැගෙන ඒම අනිවාර්ය වේ.

04. භාණ්ඩ මිලදී ගැනීම ලංකාවේ වලංගු මුදලින් කළ යුතු අතර, ඒ සඳහා අධිකරණය මඟින් රිසිට්පතක් නිකුත් කරනු ලැබේ.

05. මිලදී ගන්නා භාණ්ඩ වෙන්දේසි දින ප.ව. 4.30ට පෙර අධිකරණ භූමියෙන් ඉවත් කර ගත යුතුය.

චමින්ද කරුණාදාස,
මහෙස්ත්‍රාත් හා අතිරේක දිසා විනිසුරු,
මහේස්ත්‍රාත් අධිකරණය,
බදුල්ල.

2019 දෙසැම්බර් මස 26 වැනි දින,
බදුල්ල මහෙස්ත්‍රාත් අධිකරණයේ දී ය.

**2020.01.18 වැනි දින ප්‍රසිද්ධ වෙන්දේසියට යෝජිත භාණ්ඩ ලැයිස්තුව**

| අනු. අංකය | නඩු අංකය | නඩු භාණ්ඩ |
|---|---|---|
| 1. | 26029 | සවල් 02 |
| 2. | 29202 | සවල් 01 |
| 3. | 29203 | සවල් 01 |
| 4. | 11635 | සවල් 01 |
| 5. | 26323 | සවල් 01 |
| 6. | 25688 | සවල් 01 |
| 7. | 29343 | සවල් 01 |
| 8. | 29344 | සවල් 01 |
| 9. | 26030 | සවල් 02 |
| 10. | 29822 | සවල් 01 |
| 11. | 29950 | සවල් 01 |
| 12. | 29951 | සවල් 01 |
| 13. | 29952 | සවල් 01 |
| 14. | 30546 | සවල් 01 |
| 15. | 29948 | සවල් 01 |
| 16. | 28865 | සවල් 01 |
| 17. | 29949 | උදළු 01 |
| 18. | 71562 | උදළු 01 |
| 19. | 47577 | උදළු 01, අලවංගු 02, යකඩ තාච්චි 01 |
| 20. | 70297 | ඇලුමිනියම් මුට්ටි 01, ඇලුමිනියම් නැඹිලි 01 |
| 21. | 25548 | ඇලුමිනියම් මුට්ටි 02 |
| 22. | 16237 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 23. | 16206 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 24. | 91275 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 25. | 14532 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 26. | 14903 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 27. | 14904 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 28. | 24818 | ඇලුමිනියම් මුට්ටි 01, ඇලුමිනියම් තාච්චි01 |
| 29. | 94020 | ඇලුමිනියම් මුට්ටි 02 |
| 30. | 84310 | ඇලුමිනියම් මුට්ටි 02 |
| 31. | 90906 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 32. | 94705 | ඇලුමිනියම් මුට්ටි 01, ඇලුමිනියම් කළ 01 |
| 33. | 11397 | ඇලුමිනියම් මුට්ටි 01 |
| 34. | 15646 | ඇලුමිනියම් කළ 01 |
| 35. | 80356 | ප්ලාස්ටික් කළ 01 |
| 36. | 29609 | ජංගම දුරකථන චාජර් 01 |
| 37. | 29612 | ජංගම දුරකථන චාජර් 01 |
| 38. | 29919 | ජංගම දුරකථන චාජර් 01 |
| 39. | 299913 | ජංගම දුරකථන චාජර් 01 |
| 40. | 29610 | ජංගම දුරකථන චාජර් 01 |
| 41. | 29608 | ජංගම දුරකථන චාජර් 01 |
| 42. | 29915 | ජංගම දුරකථන චාජර් 01 |
| 43. | 29067 | ජල කරාම 01 |
| 44. | 30380 | රීචාජබල් ෆෑන් 01 |
| 45. | 25280 | වයර් රෝල් 01 |
| 46 | 87956 | ස්කුරුප්පු නියන් 02 |
| 47. | ඒ.ආර්. 1491/19 | මවුන්ටන් වර්ගයේ පා පැදි 01 |
| 48. | 87247 | විශ්වා වර්ගයේ ඩී. වී. ඩී. යන්ත්‍ර 01 |
| 49. | 6507 | බහු කාර්ය මැෂින් 01 |
| 50. | 70977 | අලවංගු 01 |
| 51. | 40898 | අලවංගු 01 |
| 52. | 75185 | අලවංගු 01 |
| 53. | 48579 | වී.සී.ඩී. යන්ත්‍ර 01 |
| 54. | 41864 | තරාදි 01 |
| 55. | 30378 | ඩිජිටල් තරාදි 01 |
| 56. | 41868 | දුනු තරාදි 01 |
| 57. | 89530 | තරාදි 01 |
| 58. | 92759 | ප්ලාස්ටික් තාච්චි 01 |
| 59. | 86962 | ගෑස් සිලින්ඩර් 01, ගෑස් ලිප් 01 |
| 60. | 74868 | ගෑස් සිලින්ඩර් 01 |
| 61. | 84465 | ස්කුරුප්පු නියන් 01 |
| 62. | 82253 | කල්දේරම් 01 |
| 63. | 73814 | 47-9596 දරන ලොරි රථය |
| 64. | 54131 | 40 ශ්‍රී 6489 දරන ලොරි රථය |
| 65. | 58837 | 41-4647 දරන ලොරි රථය |

01-447

# රජයේ නොවන දැන්වීම්

## සාමාන්‍ය ඇටර්නි බලකරය අවලංගු කිරීම

බත්තරමුල්ල, බටපොත, නුගේදෙනිය පාර, අංක 367/එෆ් හි පදිංචි නීතිඥ හා ප්‍රසිද්ධ නොතාරිස් යූ. විජේරත්න මහතා විසින් ලියා සහතික කරන ලද අංක 5894 සහ 2014.05.05 දිනැති සාමාන්‍ය ඇටර්නි බලකරය මගින් මා විසින් මහරගම, ගොඩිගමුව, පිළියන්දල පාර, අංක 177/15 හි පදිංචි වැලිවිටිය සායක්කාරගේ දිලිනි නිසංසලා යහම්පත් මිය වෙත මාගේ සත්‍ය හා නීත්‍යානුකූල ඇටර්නි බලකරු ලෙස ලබා දී තිබූ බලය අවලංගු සහ බල රහිත කරන බව මෙයින් දැනුම් දෙනු ලැබේ. ඒ අනුව මින් ඉදිරියට එකී අංක 5894 දරන ඇටර්නි බලකරය මත මා වෙනුවෙන් එකී වැලිවේරිය සායක්කාරගේ දිලිනි නිසංසලා යහම්ත් විසින් සිදු කරනු ලබන කිසිදු ක්‍රියාවක් සඳහා පහත සඳහන් දින සිට මා වග නොකියන බව ද ප්‍රකාශ කර සිටිමි.

කහට පිටියගේ ප්‍රියා දීප්ති ආමර් පෙරේරා.

2018 දෙසැම්බර් මස 17 වැනි දින.
අංක 02, සිම්ටැට් හදයියා ජිම්,
මිකනෝවෙට්,
ඊශ්‍රාලය.

01-84

---

## ඇටෝර්නි බලය අහෝසි කිරීම

ශ්‍රී ලංකා ජනරජයේ උතුරු පළාතේ, කිලිනොච්චි දිස්ත්‍රික්කයේ, මුල්ලෙ වීථියේ, 3 වැනි පටුමගේ පරන්තන් යන ලිපිනයේ පදිංචි සෙල්වමාණික්කම් කයිම්පෙන් පුෂ්පවතියම්මා (ජා. හැ. ප. අංක 425580390 V) වන මම, මුල්ලෙ වීථියේ 3 වැනි පටුමගේ පරන්තන් යන ලිපිනයේ පදිංචි සින්නයියා රාමනාදන් මහතාට ම විසින් පවරන ලද හා කිලිනොච්චි දිස්ත්‍රික්කයේ ප්‍රසිද්ධ නොතාරිස් ටී. ආරියරත්නම් මහතා විසින් 2016.12.05 වැනි දින අංක 9414 මගින් සහතික කරන ලද ඇටෝර්නි බලය මා විසින් අහෝසි කළ බව ශ්‍රී ලංකා ජන රජයටත් සියලුම ජනතාවටත් මෙයින් දන්වා සිටිමි. තවද, මෙතැන් සිට මා වෙනුවෙන් පෙනී සිටීමට ඔහු වෙත දෙන ලද ඇටෝර්නි බලය අනුව ඔහු විසින් කරනු ලබන කිසිදු ක්‍රියාවන්ට මම වග නොකියන බව ශ්‍රී ලංකා ජන රජයටත් සියලුම ජනතාවටත් මෙයින් දැනුම් දෙමි.

සෙල්වමාණික්කම් කයිම්පෙන් පුෂ්පවතියම්මා.

01-85

---

## මේනුකා සමරවික්‍රම ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් 2018.06.11 දින ලියා සහතික කළ අංක 216 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම සම්බන්ධවයි

මීගමුව, පෙරියමුල්ල, ශාන්ත අන්තෝනි පාර, අංක 24 හි පදිංචි කරිපාඩත්තු සත්‍යදාසන් ජීවන් (ජා. හැ. අ. 901363692 V) වන මා විසින් මේනුකා සමරවික්‍රම ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් වර්ෂ 2018 ක් වූ ජුනි මස 11 වැනි දින ලියා සහතික කරන ලද අංක 216 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රයේ සඳහන් ක්‍රියාවන් කිරීම සඳහා මාගේ සැබෑ සහ එකම නිත්‍යානුකූල ඇටෝර්නි බලකරු වශයෙන් තංගල්ල දංකැටිය වීරකැටිය පාර, වීරමාවත, අංක 166/15 හි පදිංචි අන්දවීර ආරච්චිගේ රංජන අන්දවීර (ජා. හැ. අංක 633372322 V) යන අයව පත් කරන ලද අතර, එය බත්තරමුල්ල පිහිටි රෙජිස්ට්‍රාර් ජෙනරාල් කාර්යාලයේ 238 වන කාණ්ඩයේ 143 දරන පත් ඉරුවේ 10058 දරන දින පොත් අංකය යටතේ 2018.06.18 වැනි දින ලියා පදිංචි කර ඇති අතර, එකී අංක 216 දරන ඇටෝර්නි බලපත්‍රය මා විසින් අවලංගු කර ප්‍රත්‍යාදිෂ්ඨ කරන බව මින් සෑම සියලු දෙනාට ම දන්වා සිටිමි. ඒ අනුව ඉහත කී අංක 216 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය මෙතැන් පටන් බල නොපවතින බව ද, එකී ඇටෝර්නි බලපත්‍රය මත එකී ඇටෝර්නි බලකරු විසින් මින් ඉදිරියට කරනු ලබන සියලුම ක්‍රියාවන් කිසිදු වලංගු භාවයක් නොමැති බවත් ප්‍රකාශ කර සිටිමි. තවද, මා විසින් කිසිදු ඇටර්නි බලයක් මෙතැන් පටන් කිසිවෙකුට ප්‍රදානය කර නැති බවත් මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් දැනුම් දෙමි.

කරිපාඩත්තු සත්‍යදාසන් ජීවන්,
ඇටර්නි අධිපති.

01-86

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : ට්‍රස්ට් නීඩ් ඉන්වෙස්ට්මන්ට් (පීවීටී) එල්ටීඩී
සමාගම් අංකය : පීවී 00217908
සමාගම සංස්ථාගත කළ දිනය : 2019.11.25
ලියාපදිංචි ලිපිනය : අංක 248/බී, කිරලගම, පූජාපිටිය.

සමාගම් ලේකම්.

01-89

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වන වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කළ බව මෙයින් දැනුම් දෙමු.

සමාගමේ නම : හෙලංකා හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගම් අංකය : පීවී 00216204
සමාගම සංස්ථාගත කළ දිනය : 2019.10.05
ලියාපදිංචි ලිපිනය : අංක 5/7, සිරිමල් මාවත, පැපිලියාන, බොරලැස්ගමුව.

සමාගම් ලේකම්.

01-90

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී :

සමාගමේ නම : තිනා එන්ටර්ටේන්මන්ට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පීවී 00218011
ලියාපදිංචි ලිපිනය : A 1/8 පෙරහැර මාවත, කොළඹ 03
සංස්ථාගත කළ දිනය : 2019.11.28

ආර්. කේ. ජයවීර මිය,
සමාගම් ලේකම්.

01-99

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රා/ලේ කොට්ඨාසයේ ද සොයිසාපුර මහල් නිවාස සී 7-3-2 දරන ස්ථානයේ පදිංචිව සිට දැනට කැනඩාවේ B. C. V3J, IN 8. කොකියුට්ලම් උතුර පාර, ඒකක 120-555 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 680633339 වී හිමි උපුල් රෝහණ දිසානායක වන මම කුරුණෑගල, උයන්දන වත්ත, පැරකුම් මාවත, අංක 28 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 612732949 V හිමි දිසානායක මුදියන්සේලාගේ නිමල් රංජිත් දිසානායක යන අය මාගේ ඇටෝර්නි බලකරු ලෙස නම් කරමින් බලපිටිය, පාරුතොට, මැටිගොඩවත්ත ලිපිනයේ පදිංචි ඊ. නදීෂ් රංගන ද සිල්වා නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 19 සහ 2016.01.27 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය 2019 දෙසැම්බර් මස 20 වැනි දින සිට අහෝසිකර අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

උපුල් රෝහණ දිසානායක.

2019 දෙසැම්බර් මස 20 වැනි දින.

01-101

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

කොළඹ දිස්ත්‍රික්කයේ, මොරටුව ප්‍රා/ලේ කොට්ඨාසයේ ද සොයිසාපුර මහල් නිවාස සී 7-3-2 දරන ස්ථානයේ පදිංචිව සිට දැනට කැනඩාවේ B. C. V3J, IN 8. කොකියුට්ලම් උතුර පාර, ඒකක 120-555 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 627510012 වී හිමි තෙල්ගේ ද යානි පද්මලතා පීරිස් වන මම කුරුණෑගල, උයන්දන වත්ත, පැරකුම් මාවත, අංක 28 හි පදිංචි ජාතික හැඳුනුම්පත් අංක 612732949 වී හිමි දිසානායක මුදියන්සේලාගේ නිමල් රංජිත් දිසානායක යන අය මාගේ ඇටෝර්නි බලකරු ලෙස නම් කරමින් බලපිටිය, පාරුතොට, මැටිගොඩවත්ත ලිපිනයේ පදිංචි ඊ. නදීෂ් රංගන ද සිල්වා නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස් තැන විසින් ලියා සහතික කරන ලද අංක 20 සහ 2016.01.27 වැනි දින දරන ඇටෝර්නි බලපත්‍රය 2019 දෙසැම්බර් මස 20 වැනි දින සිට අහෝසිකර අවලංගු කරන ලද බව ශ්‍රී ලංකා ජනරජයටත්, මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි.

තෙල්ගේ දයානි පද්මලතා පීරිස්.

2019 දෙසැම්බර් මස 20 වැනි දින.

01-102

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපනය කරන ලදී :

සමාගමේ නම : සොෆ්ට්ලයින් ඉන්ඩස්ට්‍රීස් (පුද්ගලික) සමාගම
සමාගමේ අංකය : පීවී 00208068
දිනය : 2019.01.18
ලියාපදිංචි ලිපිනය : අංක 378/2/A පල්ලිය කොටුව, පොල්වත්ත, බටුගොඩ, මහනුවර.

01-104

## කැන්ඩර් කැපිටල් (ප්‍රයිවට්) ලිමිටඩ්

සමාගම් ලියාපදිංචි අංකය පීවී 75998

සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමේ දැන්වීම

2019 නොවැම්බර් මස 14 වැනි දින සමාගමේ සම්මත වූ විශේෂ යෝජනා සම්මතය මත 2007 අංක 07 දරන සමාගම් පනතේ 319 (1) (b) වගන්තිය යටතේ මෙම සමාගම 2019 නොවැම්බර් මස 14 වැනි දින සිට සාමාජිකයන් ස්වේච්ඡාවෙන් ගණන් බේරා වසා දැමීමට තීරණය කරන ලදී.

එස්. වී. ද සෝසා,
ආර්. එන්. දේව්දි,
ටී. අයි. රහමන්,
ඩී. ආර්. අබේසූරිය,
අධ්‍යක්ෂකවරු.

2019 නොවැම්බර් මස 26 වැනි දින.

01-113

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාරව ෂිප් ස්ටෝර්ස් හබ් (ප්‍රයිවට්) ලිමිටඩ් සීමාසහිත පුද්ගලික සමාගම පහත සඳහන් විස්තර අනුව සංස්ථාපනය කරන ලදී.

සමාගමේ නම : ෂිප් ස්ටෝර්ස් හබ් (ප්‍රයිවට්) ලිමිටඩ්
සංස්ථාගත කළ දිනය : 2019 ඔක්තෝබර් 29 වැනි දින
ලියාපදිංචි අංකය : පී වී 00217046
ලිපිනය : 34/4, විජය පාර, කොළොන්නාව.

සෙයඩ් සජාඩ් අලවි,
අධ්‍යක්ෂ.

01-134

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : කැන්ඩි රූෆිං (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 94825
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 8/2, පේරාදෙණිය පාර, මහනුවර.
ලියාපදිංචි දිනය : 2013.10.02

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු.)

01-137

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

උඩුගම්පොල, සීදුව පාර, අංක 146 දරන ස්ථානයෙහි පදිංචි අංක 571213800 V දරන ජාතික හැඳුනුම්පත හිමි සුහසිංහ ආරච්චිගේ ගාමිණී ප්‍රසාද් පුෂ්ප කුමාර වන මා විසින් ගනේපොල අච්චිගේ චිත්‍රානි ප්‍රියන්ති ගනේපොල ප්‍රසිද්ධ නොතාරිස් තැන ලියා සහතික කරන ලද අංක 17343 සහ 2010.10.06 දිනැති ඇටෝර්නි බලපත්‍රය මගින් ගම්පහ උග්ගල්බොඩ සුසිල් සෙවන දරන ස්ථානයෙහි පදිංචි අංක 631180094 X දරන ජාතික හැඳුනුම්පත හිමි සුසිල් සරත් කුමාර එදිරිසිංහ යන අයට මා සම්බන්ධයෙන් කටයුතු කිරීමට පවරා දුන් ඇටෝර්නි බලය අද දින සිට අවලංගු කොට ප්‍රත්‍යාදිෂ්ය කරන බව මෙයින් දැනුම් දෙමි.

සුහසිංහ ආරච්චිගේ ගාමිණී ප්‍රසාද් පුෂ්ප කුමාර.

2019.12.18

01-140

## දැන්වීමයි

2007 අංක 7 දරන සමාගම් පනතේ 9(1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : රෙඩ් හෝක් සෙකියුරිටි (පීවීටී) එල්ටීඩී
අංකය : පී වී 00208286
ලියාපදිංචි කළ දිනය : 2019.01.31
ලියාපදිංචි ලිපිනය : අංක 200 ඩී, බෝගහවත්ත පාර, තලාහේන, මාලඹේ.

එච්. එම්. ඊ. ඩී. එච්. කුඹුරුලන්ද,
නීතිඥ සමාගමේ ලේකම්.
රෙඩ් හෝක් සෙකියුරිටි (පීවීටී) එල්ටීඩී,

01-144

---

## නිවේදනයයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර මෙසේ නිවේදනය කරනු ලැබේ.

සමාගමේ නම : ඕල් අයිලන්ඩ් ඩේරි ඇසෝසියේෂන්
ලියාපදිංචි කාර්යාලය : සිලෝන් චේම්බර් ඔෆ් කොමර්ස් (භාරයේ) 50, නවම් මාවත, කොළඹ 02
සංස්ථාපනය කළ දිනය : 2018.05.28
ලියාපදිංචි අංකය : GA 3487

අධ්‍යක්ෂ.

01-180

---

## ෂින්ඩා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

(කලින් ඔප්පෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ්

2007 අංක 7 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය යටතේ නාමය වෙනස් කිරීම පිළිබඳ ප්‍රසිද්ධ නිවේදනය

2007 අංක 7 සමාගම් පනතේ වගන්ති 8 හි විධිවිධානවලට අනුව ඔප්පෝ ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් විසින් එකී නාමය 2019 නොවැම්බර් මස 27 වැනි දින දී ෂින්ඩා ලංකා (ප්‍රයිවට්) ලිමිටඩ් (අළුත් නම) යනුවෙන් වෙනස් කර (සමාගමේ ලියාපදිංචි අංකය PV 105048) එහි ලියාපදිංචි කාර්යාලය කොළඹ 03, ලක්ෂ්මන් ගොඩනැගිල්ල, 4 වන මහල, අංක 321 හි ලිපිනයේ පිහිටුවාගෙන ඇති බව අපි මෙයින් මහජනයා වෙත දැනුම් දෙමු.

ප්‍රනවන් නීලකන්ඩන්,
අධ්‍යක්ෂක.
එන් ඇන්ඩ් එන් ඒජන්ට්ස් ඇන්ඩ් සෙක්රටරීස් (ප්‍රයිවට්) ලිමිටඩ්
(සමාගම් ලේකම්වරු)
එම් ඇන්ඩ් එන් ගොඩනැගිල්ල (5 වන තලය)
අංක 2 ඩීල් පෙදෙස,
කොළඹ 02.

01-184

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය ප්‍රකාර පහත සඳහන් සමාගම් සංස්ථාගත කරන ලදී.

සමාගමේ නම : එස්. කේ. එම්. ටයර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00217078
ලියාපදිංචි ලිපිනය : නො. 436, හැව්ලොක් පාර, කොළඹ
සංස්ථාගත කළ දිනය : 2019.10.31

සමාගමේ නම : මහිම සෙවන් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00217249
ලියාපදිංචි ලිපිනය : 25, 3 වන පටුමග, රත්මලාන
සංස්ථාගත කළ දිනය : 2019.11.05

සමාගමේ නම : යුනිලක්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00217047
ලියාපදිංචි ලිපිනය : 523/2 බී, මෛත්‍රීපාල සේනානායක මාවත, අනුරාධපුර
සංස්ථාගත කළ දිනය : 2019.10.29

සමාගමේ නම : අයි ඩබ්ලිව් ඩී අයි ටී සොලුෂන්ස් (පීවීටී) එල්ටීඩී
ලියාපදිංචි අංකය : පීවී 00216993
ලියාපදිංචි ලිපිනය : 212/1, තලපියන්නාව, උඩපාර, අම්පිටිය
සංස්ථාගත කළ දිනය : 2019.10.29

01-232

---

## දැන්වීමයි

වර්ෂ 2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් සමාගම් සංස්ථාපිත කළ බවට මෙයින් දන්වමු.

සමාගමේ නම : ඊ - විෂන් ඉන්ස්ටිටියුට් ඔෆ් ඉන්ෆොමේෂන් ටෙක්නොලොජි (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 00206958
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 18, ටුවින් හවුස්, එල් එස් පාර, අනුරාධපුරය
ලියාපදිංචි දිනය : 2018.12.06

සමාගමේ නම : ඊ එම් එස් ලෙෂර් හෝල්ඩිංස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 00212611
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 268/4/10, අඹහේන, පිටිපන දකුණ, කිරිවත්තුඩුව
ලියාපදිංචි දිනය : 2019.06.14

සමාගමේ නම : ඊ එම් එස් ප්‍රොපර්ටි ඩිවෙලොපර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 00210097
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 268/4/10, අඹහේන, පිටිපන දකුණ, කිරිවත්තුඩුව
ලියාපදිංචි දිනය : 2019.03.22

සමාගමේ නම : තරුදිසි මීඩියා නෙට්වර්ක් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී. වී. 00209422
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : නො. 168, ෆාම් ගාර්ඩන් නිව් හවුස්, හිඩෙල්ලන, රත්නපුර
ලියාපදිංචි දිනය : 2019.03.02

(ඉහත සඳහන් සමාගමේ ලේකම්වරු)

01-233

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (2) වගන්තිය ප්‍රකාරව පහත සමාගමේ නාමය වෙනස් කරන ලදී.

සමාගමේ පෙර නාමය : රන්සෙත් (ප්‍රයිවට්) ලිමිටඩ්
සමාගමේ අංකය : PV 797
ලියාපදිංචි ලිපිනය : අංක 133/23 A පාගොඩ පාර, පිටකෝට්ටෙ
සමාගමේ නව නාමය : රැන්සේත් (ප්‍රයිවට්) ලිමිටඩ්.

සමාගම් ලේකම්.

01-237

---

## ඇටර්නි බලපත්‍රය අවලංගු කිරීම

ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වන අප විසින් ප්‍රසිද්ධ නොතාරිස් කැෂ්මි වාසනා කපුවැල්ල විසින් 2018.01.09 වැනි දින ලියා සහතික කළ අංක 252 දරන ඇටර්නි බලය මගින් අපගේ ඇටර්නි බලකරු ලෙස කිරිබත්කුඹුර, පිලපිටිය, අංක 53/1, යන ලිපිනයෙහි පදිංචි උලඳුපිටියේ පටබඳලාගේ ලක්ෂ්මන් උලඳුපිටිය වෙත කර ඇති පත්කිරීම සහ එම අංක 252 දරන ඇටර්නි බලපත්‍රය මෙයින් අවලංගු කරන බවට සියලුදෙනා වෙත මෙයින් දන්වමු.

ඔලිම්පස් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ්.

01-238

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර, දිස්ත්‍රික්කයේ, පූජාපිටිය මොරගහකුඹුර පාර, අංක 52/1 යන ලිපිනයෙහි පදිංචි අධිකාරි මුදියන්සේලාගේ උදේනී කුමාරී සමරකෝන් වන පූජාපිටිය මොරගහකුඹුර පාර අංක 52/1 යන ලිපිනයේ පදිංචි අධිකාරි මුදියන්සේලාගේ නයනා කුමාරී සමරකෝන් යන අය වෙත ඇටෝර්නි බලය පවරමින් මහනුවර

ප්‍රසිද්ධ නොතාරිස් ශිරෝමී ප්‍රබෝධිකා නියාගම මහත්මිය විසින් ලියා සහතික කරන ලද 2014.09.03 දිනැති අංක 5138 දරන ඇටෝර්නි බලපත්‍රය එහි ඇටොර්නි අධිපති වන මා විසින් වර්ෂ 2019.06.19 වැනි දින අවලංගු කරන ලද බවත් මින් ඉදිරියට එකී අධිකාරී මුදියන්සේලාගේ නයනා කුමාරී සමරකෝන් යන අය විසින් එම ඇටොර්නි බලපත්‍රය උපයෝගී කර ගනිමින් සිදු කරනු ලබන කිසිදු ගනුදෙනුවකට වග නොකියන බවත් මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත් මහජනතාවටත් මෙයින් දන්වා සිටිමි. මෙම ඇටෝර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, මධ්‍යම කලාප කාර්යාලය, මහනුවර හි ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ දිනපොත් අංක 2334 යටතේ 96 කාණ්ඩයේ 55 පත් ඉරුවේ ලියාපදිංචි කරන ලදී.

අධිකාරී මුදියන්සේලාගේ උදේනී කුමාරී සමරකෝන්,
ඇටෝර්නි අධිපති.

01-248

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

මහනුවර, දිස්ත්‍රික්කයේ, පූජාපිටිය මොරගහකුඹුර පාර, අංක 52/1 යන ලිපිනයෙහි පදිංචි අධිකාරී මුදියන්සේලාගේ උදේනී කුමාරී සමරකෝන් වන පූජාපිටිය මොරගහකුඹුර පාර අංක 52/1 යන ලිපිනයේ පදිංචි අධිකාරී මුදියන්සේලාගේ මංජුලා කුමාරී සමරකෝන් යන අය වෙත ඇටෝර්නි බලය පවරමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් කේ. එස්. බී. විජේරත්න මහතා විසින් ලියා සහතික කරන ලද 2012.08.07 දිනැති අංක 3040 දරන විශේෂ ඇටෝර්නි බලපත්‍රය එහි ඇටෝර්නි අධිපති වන මා විසින් වර්ෂ 2019.06.19 වැනි දින අවලංගු කරන ලද බවත් මින් ඉදිරියට එකී අධිකාරී මුදියන්සේලාගේ මංජුලා කුමාරී සමරකෝන් යන අය විසින් එම ඇටෝර්නි බලපත්‍රය උපයෝගි කර ගනිමින් සිදු කරනු ලබන කිසිදු ගනුදෙනුවකට වග නොකියන බවත් මෙයින් ශ්‍රී ලංකා ජනරජයටත් මහ ජනතාවටත් මෙයින් දන්වා සිටිමි. මෙම ඇටෝර්නි බලපත්‍රය රෙජිස්ට්‍රාර් ජෙනරාල් දෙපාර්තමේන්තුව, මධ්‍යම කලාප කාර්යාලය, මහනුවර හි ලිඛිත බලධාරිකම් හා ඇටෝර්නි බලපත්‍ර පොතේ දිනපොත් අංක 2481 යටතේ 75 කාණ්ඩයේ 51 පත් ඉරුවේ ලියාපදිංචි කරන ලදී.

අධිකාරී මුදියන්සේලාගේ උදේනී කුමාරී සමරකෝන්,
ඇටෝර්නි අධිපති.

01-249

---

## ඇටෝර්නි බලපත්‍රය අවලංගු කිරීම

පල්ලේකැලේ තැපැල් තුරුණුසවියගම අංක 22 හි පදිංචි වික්‍රමආරච්චිගේ රසාන්තිමාලා වික්‍රමනායක (ජා. හැ. අ. 668631207 V) වන මම රජවැල්ල තැපැල් දිගන නව නගරය අංක 175, ගුණවර්ධන එන්ටප්‍රයිසස් දරන ස්ථානයේ දොන් රජීව මංගල ගුණවර්ධන (ජා. හැ. අ. 692871685 V) යන අය පත්කරමින් මහනුවර ප්‍රසිද්ධ නොතාරිස් අයි. එම්. පී. ගුණතිලක මහත්මිය විසින් 2019.08.21 වැනි දින ලියා සහතික කර ලබා දෙන ලද අංක 1072 දරන ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කර අවලංගු කරන බවත්, අද පටන් එකී ඇටෝර්නි බලකරු දොන් රජීව මංගල ගුණවර්ධන යන අය විසින් මා වෙනුවෙන් කරන ලද කිසියම් හෝ කරුණකට මා වග නොකියන බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය වෙත සහ මහජනතාව වෙත මින් දන්වා සිටිමි.

වික්‍රමආරච්චිගේ රසාන්තිමාලා වික්‍රමනායක.

01-275

---

## දැන්වීමයි

2007 අංක 07 දරන සමාගම් පනතේ 9 (1) වගන්තිය යටතේ පහත සඳහන් සමාගම සංස්ථාපිත කළ බැව් මින් දන්වනු ලැබේ.

සමාගමේ නම : ශෙරොන් එක්ස්පෝට් ඉම්පෝට් (ප්‍රයිවට්) ලිමිටඩ්
ලියාපදිංචි අංකය : පී වී 00203925
ලියාපදිංචි කළ දිනය : 2018.09.08
ලියාපදිංචි කාර්යාලීය ලිපිනය : අංක 62, විදාන්ස් පටුමග, චුන්ඩික්කුලි, යාපනය.

සමාගම් ලේකම්.

01-290

# වෙන්දේසි කිරීම් පිළිබඳ දැන්වීම්

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

මෙක් ප්ලාන්ටේෂන්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්.
ගිණුම් අංක : 0175 1000 4116.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.07.25 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් දෙකෝටි විසි එක් ලක්ෂ හතලිස් අට දහස් හයසිය පනස් තුනයි ශත අටක (රු. 22,148,653.08) මුදල ද, 2019 ජූනි මස 21 දින සිට අංක 2921 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක් කෝටි අනූ එක් ලක්ෂ හැට පන් දහසක (රු. 19,165,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16%.5) හා තවත් රුපියල් පහළොස් ලක්ෂයක (රු. 1,500,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට විස්සක් (20%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.11.01 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.10.01 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.01.23 වැනි දින පෙ.ව. 11.00 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

**උපලේඛනය**

මධ්‍යම පළාතේ, මහනුවර දිස්ත්‍රික්කයේ හේවාහිස්ස කෝරළේ දෙල්තොට නගර සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ, දෙල්තොට බෝපිටිය නගරයේ, අංක 1038 දරන ග්‍රාම නිලධාරී කොට්ඨාසය තුළ බෝපිටිය ග්‍රාමයේ පිහිටි **"බෝපිටිය එස්ටේට්"** යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. ඒ. රත්නායක යන අය විසින් සාදන ලද 2015 මැයි මස 20 දාතම හා **අංක 2175** දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට **ලොට් 1, ලොට් 2, ලොට් 3, ලොට් 4, ලොට් 5 සහ ලොට් 6** වශයෙන් ලකුණු කොට ඇති ඉඩම් කොටසට මායිම්, **උතුරට** : බෝපිටිය කොට්ඨාස ක්ෂේත්‍ර අංක 01AB හි ඉතිරි කොටස, **නැගෙනහිරට** : බෝපිටිය කොට්ඨාස ක්ෂේත්‍ර අංක 01ABහි ඉතිරි කොටස, **දකුණට** : බෝපිටිය කොට්ඨාස ක්ෂේත්‍ර අංක 01AB හි ඉතිරි කොටස සහ **බස්නාහිරට** : බෝපිටිය කොට්ඨාස ක්ෂේත්‍ර අංක 01AB හි ඉතිරි කොටස යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් **අක්කර එකයි පර්චස් අටයි දශම දෙකක්** (A. 1, R. 0, P. 8.2) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක **2175** දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ඉරුව **P** 08/01 යටතේ මහනුවර ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි,

සමාගම් ලේකම්.

01-258

---

**සම්පත් බැංකුව පීඑල්සී**
(සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

රෝලංකා ට්‍රේඩ් සෙන්ටර්.
ගිණුම් අංක : 0005 1001 2445.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.10.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් එක්කෝටි හැත්තෑ හත් ලක්ෂ විසිපන් දහස් හයසිය තිස් අටයි ශත තිස් පහක (රු. 17,725,638.35) මුදල ද, 2019 ඔක්තෝබර් මස 10 වැනි දින සිට අංක 2091, 228, 2473, 1495, 1915 සහ 1981 දරන උකස් බැඳුම්කර මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් එක්කෝටි නම ලක්ෂ හාර දහසක (රු. 10,904,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහසයයි දශම පහක් (16.5%) හා තවත් රුපියල් පනස් ලක්ෂ හැත්තෑ නම දහස් නමසිය අනූ පහයි ශත හැට තුනක (රු. 5,079,995.63) මුදලක් සඳහා වාර්ෂිකව සියයට පහළවයි දශම පහක් (15.5%) හා තවත් රුපියල් දස ලක්ෂයක (රු. 1,000,000) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොලිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන්

දේපළ සහ පරිශ්‍රයන් 2019.12.06 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.12.04 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.02.06 වැනි දින ප.ව. 2.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ, අධිකාරි පත්තුවේ, කැළණිය ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ කොහල්විල අංක 259B දරන ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ දළුගම කොහල්විල ග්‍රාමයේ පිහිටි පන්සල පාර වරිපනම් අංක 119/05 දරන "කුරුඳුවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2013 ජූලි මස 10 දාතම හා අංක 761/2013 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 2B/1 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රොසලින් අමරසිංහ සහ වෙනත් අයගේ ඉඩම, නැගෙනහිරට : අංක 144/1999 දරන පිඹුරේ ලොට් 2C , දකුණට : අංක 144/1999 දරන පිඹුරේ ලොට් 2A සහ ලොට් 2 D/1 (පාර සඳහා වෙන්කිරීම) ඩී. ජයරත්න මහත්මියගේ ඉඩම සහ බස්නාහිරට: අංක 144/1999 දරන පිඹුරේ ලොට් 2A සහ ලොට් 2 D/1 (පාර සඳහා වෙන්කිරීම) සහ ඩබ්ලිව්. එම්. කේ. පෙරේරා සහ වෙනත් අයගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් විසිහතරයි දශම බිංදුවයි පහක් (A.0, R.1, P. 24.05) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 761/2013 දරන පිඹුරට අනුවය.

එකී ලොට් 2B/1 පහතින් විස්තර කොට ඇති ඉඩමේ නැවත මිනුමකි.

එකී දළුගම කොහල්විල ග්‍රාමයේ පිහිටි "කුරුඳුවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන කේ. ඒ. රූපසිංහ යන අය විසින් සාදන ලද 1999 මාර්තු මස 05 දාතම හා අංක 144/1999 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදා වෙන්කොට ලොට් 2B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : රොසලින් අමරසිංහ සහ වෙනත් අයගේ ඉඩම, නැගෙනහිරට : ලොට් 2C, දකුණට: මෙම ඉඩමේ ලොට් 2A, 2B සහ ඩී. ජයරත්න මහත්මියගේ ඉඩම සහ බස්නාහිරට : ලොට් 2A, 2D සහ කරුණා පෙරේරාගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි, පර්චස් විසිපහයි දශම අටයි බිංදුවක් (A.0, R.1, P. 25.80) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, සහ එහි පිහිටි සෑම සියලු දේ සමග එකී අංක 144/1999 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍ර්‍රුව G 38/144 යටතේ කොළඹ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

(බලයලත් මානක තැන කේ. ඒ. රූපසිංහ යන අය විසින් සාදන ලද 1999 මාර්තු මස 05 දාතම හා අංක 144/1999 දරන එකී පිඹුරේ ලොට් 2D හි නැවත මිනුමක් වන) බලයලත් මානක තැන ඩබ්ලිව්. ආර්. එම්. ප්‍රනාන්දු යන අය විසින් සාදන ලද 2013 ජූලි මස 10 දාතම හා අංක 761/2013 දරන පිඹුරේ ලොට් 2 D/1 දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද සමග ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

01-255/1

---

### සම්පත් බැංකුව පීඑල්සී
### (සීමාසහිත සම්පත් බැංකුව නමින් කලින් හැඳින්වූ)

### 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ කරනු ලබන විකුණුම් නිවේදනය

පී. ඒ. ඒ. ඩී. ද සේරම්.
ගිණුම් අංක : 1005 5046 3258.

1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදනය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 09 වැනි වගන්තිය යටතේ ලැබී ඇති බලතල ප්‍රකාර 2019.10.31 දින සම්පත් බැංකුව පීඑල්සී අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කර ගන්නා ලද යෝජනා සම්මුතියට අනුව රුපියල් හැත්තෑ හත් ලක්ෂ පනස් හතර දහස් තුන්සිය විසි පහයි ශත තිස් තුනක (රු. 7,754,325.33) මුදල ද, 2019 ඔක්තෝබර් මස 05 වැනි දින සිට අංක 2331 දරන උකස් බැඳුම්කරය මත අයවිය යුතු මුළු මුදල පියවනු ලබන දිනය තෙක්, රුපියල් හැත්තෑ හතර ලක්ෂ අනූ දහස් පන්සිය දහසයයි ශත හතලිස් හතක (රු. 7,490,516.47) මුදලක් සඳහා වාර්ෂිකව සියයට දහ තුනක් (13%) බැගින් වූ පොළිය ද, දැන්වීම් ගාස්තු ද, ප්‍රචාරණ වියදම් ද, දරන්නට සිදු වූ ගාස්තු ද, වෙනත් තදනන්තරව දරන්නට සිදු වූ යම් මුදලක් වෙතොත් ඒවා අඩු කොට අයකර ගැනීම සඳහා මෙහි උපලේඛනයේ සඳහන් දේපළ සහ පරිශ්‍රයන් 2019.12.06 වැනි දින රජයේ ගැසට් පත්‍රයේ 2019.12.04 වැනි දින ''දිවයින'' සහ ''තිනකුරල්'' සහ ''අයිලන්ඩ්'' දිනපතා ප්‍රවෘත්ති පත්‍රවල පළකොට ඇති පරිදි 2020.02.06 වැනි දින ප.ව. 1.30 ට පිහිටි ස්ථානයේ දී කොළඹ

බලයලත් වෙන්දේසිකරුවන් වන පී. කේ. ඊ. සේනාපති යන අය විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලබන බව මෙයින් දැනුම් දෙනු ලැබේ.

### උපලේඛනය

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, සියනෑ කෝරළේ අදිකාරි පත්තුවේ බියගම ප්‍රාදේශීය සභා සීමාවන් තුළ සහ ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාල කොට්ඨාසයේ ගල් ඒදණ්ඩ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුල ගල් ඒදණ්ඩ ග්‍රාමයේ පිහිටි ගල් ඒදණ්ඩ පාර වරිපනම් අංක 139/34 දරන "හල්ගහවත්ත සහ මීගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන ඩී. සී. එම්. එස්. විමලරත්න යන අය විසින් සාදන ලද 2015 අගෝස්තු මස 10 දතම හා අංක 134/2015 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් B3B වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම් : උතුරට : මෙහි ලොට් B3A, නැගෙනහිරට : අංක 8863 දරන පිඹුරේ ලොට් B5 (අඩි 15 පළල පාර), දකුණට : මෙහි ලොට් B3C සහ බස්නාහිරට : කලින් පීරිස්ගේ ඉඩම යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් එකයි පර්චස් හයයි දශම එකක් (A.0, R.1, P. 6.1) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 134/2015 දරන පිඹුරට අනුවය.

### අංක 134/2015 දරන පිඹුරේ නිරූපිත එකී ලොට් B3B පහතින් විස්තර කොට ඇති ඉඩමේ උපබෙදුමකි

එකී ගල් ඒදණ්ඩ ග්‍රාමයේ පිහිටි " හල්ගහවත්ත සහ මීගහවත්ත" යයි කියනු ලබන ඉඩමට බලයලත් මානක තැන වි. එෆ්. ජේ. පෙරේරා යන අය විසින් සාදන ලද 1984 මැයි මස 05 වැනි දින හා අංක 8863 දරන පිඹුරේ නිරූපිත සීමා නිර්ණය කොට බෙදාවෙන්කොට ලොට් B3 වශයෙන් ලකුණුකොට ඇති ඉඩම් කොටසට මායිම්, උතුරට : ලොට් B2, නැගෙනහිරට : ලොට් B5, දකුණටඃ ලොට් B4 සහ බස්නාහිරට : ලොට් A යන මායිම් තුළ පිහිටි ප්‍රමාණයෙන් රූඩ් දෙකයි පර්චස් තිස් නමයයි දශම හයක් (A.0, R.2, P. 39.6) විශාල ඉඩම් කොටස පස, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සැම සියලු දේ සමග එකී අංක 8863 දරන පිඹුරට අනුව වෙළුම/පත්‍රිරුව N 270/54 යටතේ ගම්පහ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ලියාපදිංචි කොට ඇත.

එකී අංක 8863 දරන පිඹුරේ ලොට් B5 දිගේ හා ඒ මතින් ඒ යටින් ගමන් කිරීමේ හා මාර්ග අයිතිය ද ඒ හා සම්බන්ධ වෙනත් අයිතීන් ද සමඟ ය.

අධ්‍යක්ෂ මණ්ඩලයේ අණ පරිදි.

සමාගම් ලේකම්.

01-255/2

### පබ්ලික් බැංකුව බර්හාඩ්

**1988 අංක 30 දරන පනතේ බැංකු ව්‍යාපාරයේ අර්ථය ඇතුළත බලයලත් වාණිජ බැංකුවක් වන සහ 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය සහ එහි සංශෝධන (එකී 1990 අංක 4 දරන පනත) මගින් මා වෙත පවරා ඇති බලය ප්‍රකාර ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ සියනෑ කෝරළේ අධිකාරි පත්තුවේ පමුණුවිල ග්‍රාම නිලධාරි කොට්ඨාසය (ග්‍රාම. නි. කො. අංක 265) සහ බියගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ බියගම ප්‍රාදේශීය සභාව ඇතුළත කැලණිය, පමුණුවිල, තිස්ස පාර හෙවත් පමුණුවිල පාරේ, වරිපනම් අංක 74/1, දරන ස්ථානයේ පිහිටි ''බටදෙබගහවත්ත'' නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ඩබ්. ආර්. එම්. ප්‍රනාන්දු විසින් 2006 ජූලි 2 වැනි දින පිළියෙල කරන ලද අංක 729ඒ/2006 දරන පිඹුරේ දැක්වෙන ලොට් ඒ දරන

ප්‍රමාණය :

රූඩ් දෙකයි පර්චස් බිංදුවයි දශම හයයි බිංදුවක් (අ. 0, රූ. 2, පර්. 0.60) විශාල ඉඩම සමග පස්, ගහකොළ, වගාවන්, ගොඩනැගිලි සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

දිගේ, යටින් සහ මතින් තුළ මාර්ගයේ අයිතිය සහ අනිත් අන්තර්ගත අයිතිවාසිකම් සමග වේ.

ලොට් ඒ 1 (මාර්ග අයිතියක් වන) (අක්. 0, රූ. 0, පර්. 4.85)

''දිල්කි එන්ටර්ප්‍රයිසස්'' යන නාමය විලාසය සහ ආයතනය යටතේ හවුල් ව්‍යාපාරය පවත්වාගෙන යන සෙනෙවිරත්න මුදලිගේ නලින් සුරංග සෙනෙවිරත්න සහ නානායක්කාර වසම් එගොඩගේ ඉනෝකා සෙව්වන්දි යන අය විසින් පබ්ලික් බැංකුව බර්හාඩ් හට උකස් කරන ලද ඉහත උපලේඛනයේ සඳහන් දේපළ **වර්ෂ 2020ක් වූ ජනවාරි මස 24 වැනි දින ප. ව. 2.00 ට** ඉහත ස්ථානයේදී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2020.01.03 වැනි දින රජයේ *ගැසට් පත්‍රය* ද, දිවයින, ද අයිලන්ඩ් සහ තිනකුරල් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම*. - කිරිබත්ගොඩ නගරයේ සිට මෙම දේපළ වෙත ළඟා වීමට මාකොළ පාර ඔස්සේ ගල්පොත්ත හංදිය දක්වා කිලෝමීටර 1.70ක දුරක් ගමන් කර පමුණුවිල පාරට දකුණට හැරී මීටර් 400ක් පමණ යන විට මෙම දේපළ පාරට යාබදව වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*. - විකිණීම ස්ථිර කළ වහාම ගැණුම්කරු විසින් පහත සඳහන් ගෙවීම් වෙන්දේසිකරු වෙත මුදලින් ගෙවිය යුතු ය.

(01) ගැණුම් මිලෙන් සියයට දහයක් (10%), (02) පළාත් සභා අයබදු සඳහා සියයට එකයි (1%), (03) වෙන්දේසිකරුගේ කොමිස්

මුදල් විකුණුම් මිලෙන් සියයට දෙකයි දශම පහයි (2.5%), (04) නොතාරිස් ගාස්තු සහ ගමන් ගාස්තුව, (05) ලිපිකරු හා සෝෂක වේතනය රු. 1,500, (06) වෙන්දේසිය සඳහා වැය කරන ලද සියලුම ප්‍රචාරක වියදම්, (07) ගැණුම් මිලෙන් ඉතිරි සියයට අනූව (90%) විකිණීමේ දින සිට දින 30ක් තුළ දී අංක 340, ආර්. ඒ. ද මැල් මාවත, කොළඹ 03 හි පබ්ලික් බැංකුව බර්හාඩ් හි තැන්පත් කළ යුතු ය.

හිමිකම් ඔප්පු පරීක්ෂා කිරීම සහ වැඩි විස්තර සඳහා පහත සඳහන් අයගෙන් විමසන්න :-

එල්. බී. සේනානායක,
සාම විනිසුරු, බලයලත් ජ්‍යෙෂ්ඨ වෙන්දේසිකරු,
තක්සේරුකරු, උසාවි කොමසාරිස්.

අංක 200, 2 වන මහල උසාවි පාර,
කොළඹ 12.
දුරකතන/ෆැක්ස් අංක : 011- 2445393
ඊමේල් : senaservice84@gmail.com

ණය ප්‍රධානි,
පබ්ලික් බැංකුව බර්හාඩ්,
අංක 340, ආර්. ඒ ද මැල් මාවත,
කොළඹ 03.
දුරකතන අංක 077 - 7679589

01-193

---

HNB 358-19

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - කුරුඳුවත්ත ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට ලියා සහතික කරන ලද අංක 3784 සහ 2018.08.03 වැනි දින දරන, උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම ජෝශප් සත්‍යජිත් මොරායිස් සහ ජෝෂප් රබින්ද්‍රනාත් මොහාන් මොරායිස් යන අය ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ **2020 ක් වූ ජනවාරි මස 20 වැනි දින පෙරවරු 10.30 ට** එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ අධිකාරි පත්තුවේ හේවාගම් කෝරළේ කොළොන්නාව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ කොටිකාවත්ත මුල්ලේරියාව ප්‍රාදේශීය සභා සීමාව තුළ රාජසිංහගම 502 සී ග්‍රාම නිලධාරි වසම තුළ මුල්ලේරියාවේ පිහිටි මාලඹේ තලාහේන තලංගම පටුමග, ඕකිඩ් අපාර්ට්මන්ට්ස් වරිපනම් අංක 20/177 1/1 දරන ඕකිඩ් අපාර්ට්මන්ට්ස් - 1 නමැති ගොඩනැගිල්ලේ පළමු මහලේ පිහිටි බලයලත් මිනින්දෝරු කේ. එම්. ඒ. එච්. බණ්ඩාර විසින් සාදන අංක 5300 සහ 2016 මැයි මස 10 වැනි දින දරන සහාධිපත්‍ය පිඹුරේ අංක 1ඒ/එෆ්1/පී2 දරන නේවාසික සහාධිපත්‍ය දේපළ ප්‍රමාණයෙන් වර්ග මීටර් අසූහයයි දශම නවයයි තුනක (ව. මී. 86.93) විශාලත්වයෙන් වූ බිම් ප්‍රමාණය වේ.

මෙම 1ඒ/එෆ්1/ ජී 2 දරන සහාධිපත්‍ය දේපලට අයත් පොදු උපාංගයන්හි සහාධිපත්‍ය දේපළේ නොබෙදූ කෙටස් වටිනාකම 1.19% වේ.

මෙම 1ඒ/එෆ්1/පී2 දරන සහාධිපත්‍ය දේපළට ආසන්න පොදු ප්‍රවේශය සීඊ 30 වන අතර, 1ඒ/එෆ්1/පී2 දරන සහාධිපත්‍ය දේපළට එක් රථගාලක් වෙන් කරන තිබේ.

බලයලත් මිනින්දෝරු කේ. එම්. ඒ. එච්. බණ්ඩාර විසින් සාදන අංක 4104 සහ 2012.09.30 වැනි දින දරන පිඹුරේ ලොට් ආර් 15, ආර් 19, ආර් 10 සහ ආර් 1 වශයෙන් ලකුණු කර දක්වා ඇති ඉඩම් කොටස් මතින් හා ඒ දිගේ දිවෙන මාර්ග අයිතිය ද සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.11.08 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2019.11.13 වැනි දින මව්බිම, තිනකුරල් සහ ඩේලිමිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම*.- මාලඹේ නගර මධ්‍යයේ සිට කඩුවෙල පාරේ කි. මී. 1 1/2ක් පමණ ගමන් කර, චන්ද්‍රිකා කුමාරතුංග මාවතට වමට හැරී, එම පාරේ අවසානය දක්වා කි. මී. 3ක් පමණ ගමන් කර, එතැනින් නිවාසිපුර පාරට දකුණට හැරී මීටර් 250ක් පමණ ගියවිට ඕර්කිඩ් නිවාස සංකීර්ණයට ළඟාවිය හැකි ය.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තිමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් දහසක් (රු. 1,000) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජොෂ්ඨ කළමණාකරු.- (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකතන අංක : 2661866, 2661828 ගෙන් ලබාගත හැක.)

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනට ම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 56, මඩිහේ නාහිමි මාවත,
මහරගම.
දුරකථන අංක : 0777-378441/0714-424478
ෆැක්ස් අංකය : 0112 - 509442.

01-189

---

HNB 357-19.

**හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. - බොරැල්ල ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කොළඹ ප්‍රසිද්ධ නොතාරිස් එස්. ආර්. ෆායිස් විසින් සහතික කරන ලද්දා වූ ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට ලියා සහතික කරන ලද අංක 3882 සහ 2018.11.26 වැනි දින දරන, උකස් බැඳුම්කරය යටතේ අයවිය යුතු මුදල් ගෙවීම, හේවා මාගල්ලගොඩගේ රුවනි යන අය ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින්, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අය විය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ **2020 ක් වූ ජනවාරි මස 20 වැනි දින පස්වරු 3.00 ට** එම දේපළ පිහිටි ස්ථානයේදී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

1. බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ සල්පිටි කෝරලේ පල්ලේ පත්තුවේ කැස්බෑව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය සහ බොරලැස්ගමුව නගර සභා සීමාවේ 533 ඒ බොරලැස්ගමුව නැගෙනහිර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ පිහිටි බක්මීගහදෙණිය සහ ඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් 2009 නොවැම්බර් මස 10 වැනි දින සාදන ලද අංක 3064 දරන පිඹුරේ ලොට් 3 ඒ වශයෙන් ලකුණු කර ඇති ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහහතරක (අ. 0 රූ. 0 පර්. 14) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

2. ඉහත කී බක්මීගහදෙනිය සහ ඕවිට නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු ජේ. පී. එන්. ජයසුන්දර විසින් 2009 නොවැම්බර් මස 10 වැනි දින සාදන ලද අංක 3064 දරන පිඹුරේ ලොට් 4 ඒ වශයෙන් ලකුණුකර ඇති ඉඩම් කොටස ප්‍රමාණයෙන් පර්චස් දහහතරක (අ. 0 රූ. 0 පර්. 14) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.11.01 දින රජයේ *ගැසට් පත්‍රය* හා 2019.11.13 වැනි දින මව්බිම, තිනකුරල් සහ ඩේලිමිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම*.- බොරලැස්ගමුව හන්දියේ සිට හොරණ පාරේ මීටර් 850ක් පමණ දුරක් ගමන් කර පිරිවෙන පාරට වමට හැරී එම පාරේ මීටර් 300ක් පමණ ගොස් එම පාරේ දකුණු අත පැත්තේ ඇති දේපළට ළඟාවිය හැකි ය.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.

1. ගැණුම් මුදලින් සියයට දහය (10%)ක් ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදාහක් (රු. 2,000) ක් ද,
5. ලිපිකරු සහ සෝෂක ගාස්තු රුපියල් දහසක් (රු. 1,000) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජොෂ්ඨ කළමණාකරු.- (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන්

නැෂනල් බැන්ක් පී. එල්. සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

(දුරකතන අංක : 2661866, 2661828 ගෙන් ලබාගත හැක)

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනට ම සාම විනිසුරු),
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 56, මඩිහේ නාහිමි මාවත,
මහරගම.
දුරකථන අංක : 0777-378441/0714-424478
ෆැක්ස් අංකය : 0112 - 509442.

01-188

---

## මහජන බැංකුව - මැද පාර ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඈ" වගන්තිය යටතේ යෝජනා සම්මතය

### වටිනා නිවසක් සහිත දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මධ්‍යම පළාතේ, මාතලේ දිස්ත්‍රික්කයේ, මාතලේ දකුණ කොහොන්සියා පත්තුවේ, උකුවෙල ප්‍රාදේශීය සභා සීමාව ඇතුළත, උකුවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 356, වරකාමුර ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, වරකාමුර පිහිටා ඇත්තා වූ ද, උඩහවත්ත, හිංනාරංගහමුලවත්ත සහ මීරාගෙවත්ත යනුවෙන් හඳුන්වනු ලබන මාතලේ ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ, අංක F 66/13 යටතේ ලියාපදිංචි වී ඇති එකී අංක 2772 දරන පිඹුරට අනුව ප්‍රමාණයෙන් පර්චස් දහයක් වූ (අ.0, රූ.0, පර්.10) බෙදා වෙන් කරන ලද ඉඩම් කොටස සහ ඒ මත වූ ගොඩනැගිලි සහ වෙනත් සියලු දේ ද වේ.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **වර්ෂ 2020 ජනවාරි මස 21 සවස 2.30ට** දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.-* කොළඹ සිට මාතලේ දක්වා මාර්ගයේ ගොස් වරකාමුර මහජන බැංකු උකස් මධ්‍යස්ථානය අසලින් වමට ඇති පාරේ පෝසිලේන් කම්හල දක්වා ගොස් එහි ප්‍රධාන ගේට්ටුවට මදක් මෙපිටින් පාරේ වම්පසට ඇති අඩි 5ක් පමණ වූ අතුරු කොන්ක්‍රීට් පාරේ, මීටර් 300ක් පමණ යන විට පාරේ දකුණු පස අදාළ දේපළ පිහිටා ඇත.

වැඩි විස්තර සඳහා 2019.11.22 දිනැති දිණමින හා ඩේලිනිව්ස් පුවත්පත්වල පළවූ වෙන්දේසි යෝජනාව සහ 2019.11.22 වැනි දින ගැසට් පත්‍රයේ පළකල වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. :-

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියට ගෙවිය යුතු 1%ක් වන පළාත් අධිකාරි බද්ද ,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා සෝෂක ගාස්තු වශයෙන් රු. 500.00 ක්,
5. විකුණුම් වියදම් සමග වෙනත් ගාස්තු වෙතොත් එම මුදල,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,

ගැණුම් මිලෙන් 90% ක් වූ මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත කොළඹ උතුර ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ, කළමනාකරු වෙත ගෙවිය යුතු ය. මහජන බැංකුව, අංක 11, ආදිපාද වීදිය, කොළඹ 01.
දුරකථන අංක : 011-2344982-5, 011-2344985
ෆැක්ස් අංකය : 94(0) 11243597

හිමිකම් ඔප්පු සහ වෙනත් අදාල විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත්, ගෙවා ඇති ගැණුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිව්රුම් ලත් භාෂා පරිවර්තක.

"කිංස්වීව්" නිවස,
282/3, 5/2, කෝට්ටේ පාර, නුගේගොඩ.
දුරකථන අංකය : 071-8021206

01-241

---

## මහජන බැංකුව - කොට්ටාව ශාඛාව

### 1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඈ" වගන්තිය යටතේ යෝජනා සම්මතය

### වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම (ඉඩම් කැබලි 2ක්)

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 498ඒ, මාකුඹුර උතුර ග්‍රාම නිලධාරි

වසමේ, මාකුඹුර යන ගම පිහිටි, වරිපනම් අංක 47/90, මායා මාවත යන ස්ථානයේ පිහිටි "දෙල්ගහවත්ත" නැමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එස්. එස්. ජයලත් මහතා විසින් 2014.04.07 වැනි දින මැන සාදන ලද අංක 2014/759 ඒ දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කරන ලද ලොට් අංක 01 දරන රූඩ් එකයි (අ.0, රූ.1, පර්.0) හෙවත් හෙක්ටයාර් 0.1012ක් විශාල ඉඩම සහ එහි තුළ පිහිටි ගහකොළ, පළතුරු, ගොඩනැගිලි ආදී සියලු දේත් වේ.

මෙම දේපළ හෝමාගම ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ සී 180/21, 64 හි ලියාපදිංචි කර ඇත.

ඉහත විස්තර කළ ඉඩම බලයලත් මිනින්දෝරු පී. කේ. සුමනදාස මහතා විසින් 1991.05.25 වැනි දින මැන සකස් කරන ලද අංක 76/2831 දරන පිඹුරේ ලොට් අංක 09හි නැවත මැන බෙදා වෙන්කරගත් කොටසක් වන අතර එය පහතින් විස්තර කර ඇති ඉඩමේ නැවත මැනීමකි.

බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ, හේවාගම් කෝරළයේ, පල්ලේ පත්තුවේ, මහරගම නගර සභා සීමාව තුළ, මහරගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 498 ඒ, මාකුඹුර උතුර ග්‍රාම නිලධාරි වසමේ, මාකුඹුර ගමේ පිහිටි "දෙල්ගහවත්ත" නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු සී. ද එස්. ගුණතිලක මහතා විසින් 1980.03.23 සහ 1980.04.06 වැනි දින මැන සාදන ලද අංක 721 දරන පිඹුර ප්‍රකාර බෙදා වෙන්කරන ලද ලොට් අංක 09 දරන අක්කර එකක (අ.01, රූ.0, පර්.0) විශාල ඉඩම සහ එහි පිහිටි ගහකොළ, පළතුරු හා ගොඩනැගිලි ඇතුළත් සියලු දේ වේ. මෙම දේපළ හෝමාගම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ සී 147/37හි ලියාපදිංචි කර ඇත.

බලයලත් මිනින්දෝරු සී. ද ඇස්. ගුණතිලක 1980.04.06 සහ 1980.03.23 දින මැන සාදන ලද අංක 721 දරන පිඹුරේ ලොට් අංක 01 සහ 08 දරන පොදු ප්‍රවේශ මාර්ගවල පරවශතා අයිතිය සහ ඉහත කී අංක 2014/759ඒ දරන පිඹුරේ ඩී1 සහ ඩී5 වශයෙන් දක්වා ඇති කාණුවල අයිතිය ද සමග ය.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **වර්ෂ 2020 පෙබරවාරි මස 01 වැනි දින පෙරවරු 10.30ට** දේපළ පිහිටි ස්ථානයේ දී ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපලට පිවිසීම.*- කොට්ටාව මංසන්ධියේ සිට හයිලෙවල් පාර ඔස්සේ හෝමාගම දෙසට කි. මී.02ක් පමණ ඉදිරියට ගිය විට හමුවන දක්ෂිණ අධිවේගී අන්තර් හුවමාරුව පසුවන විට දකුණු පසින් හමුවන මායා මාවත ඔස්සේ මීටර් 300ක් පමණ යනවිට දකුණු පසින් හමුවන තුන්වන පටුමගේ මීටර් 75ක් පමණ යනවිට පාරට මුහුණලා දකුණු පසින් මෙම දේපළ පිහිටා ඇත.

වැඩි විස්තර සඳහා 2017.10.17 දිනැති "දිනමිණ"හා "Daily News" පුවත්පත්වල පළවූ වෙන්දේසි යෝජනාව සහ 2017.09.15 වැනි දින ගැසට් පත්‍රයට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.*- වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. :-

1. ගැණුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් ,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500.00 ක්,
5. විකුණුම් වියදම් සමග කොමිස් ගාස්තු වෙතොත් එම මුදල් ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,

ගැණුම් මිලෙන් 90% ක මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත දී හයිලෙවල් පාර, නුගේගොඩ අංක 117A හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ (කොළඹ පිටත) ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2768018, 2812260
ෆැක්ස් අංකය : 2817737

හිමිකම් ඔප්පු සහ වෙනත් අදළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුළත නොගෙවුවහොත්, ගෙවා ඇති ගැනුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිවුරුම්ලත් භාෂා පරිවර්තක.

අංක 282/3, 5/2, මට්ටම,
කිංග්ස් විව් රෙසිඩන්ස්,
කෝට්ටේ පාර,
නුගේගොඩ.
දුරකථන අංක : 071-8021206

01-242

---

**මහජන බැංකුව - බත්තරමුල්ල ශාඛාව**

1986 අංක 32 දරන පනතින් සංශෝධිත 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 29 "ඈ" වගන්තිය යටතේ යෝජනා සම්මතය

**වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම**

බස්නාහිර පළාතේ, ගම්පහ දිස්ත්‍රික්කයේ, මීරිගම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 40බී, විජය රජදහන සහ 40 සී, තිළිණගම ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, අම්බන ගමෙහි පිහිටියාවූ ද, සර්වේයර් ජෙනරාල් විසින් සහතික කරන ලද අංක 510216 දරන කැඩැස්තර සිතියමේ (Cadastral Map) කලාප 01හි පත්‍ර අංක 01 කැබලි අංක 0002 වශයෙන් දැක්වෙන පිඹුර ප්‍රකාරව හෙක්ටයාර් බින්දුවයි දශම බින්දුවයි තුනයි හයයි එකක (හෙක්. 0.0361) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් හා එහි පිහිටි සියලුම දේත් සමග වේ.

මෙය මීගමුව ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ හිමිකම් පත්‍රිරු අංක 2516235 යටතේ ලියාපදිංචි කර ඇත.

මහජන බැංකුව විසින් මා වෙත පවරන ලද බලය යටතේ මා විසින් **වර්ෂ 2020 ජනවාරි මස 25 වැනි දින පෙරවරු 11.30ට දේපළ පිහිටි ස්ථානයේ දී** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළට පිවිසීම.-* කොළඹ -නුවර පාරේ, පස්යාල හන්දිය දක්වා ගමන් කර එතැනින් මීරිගම පාර ඔස්සේ ගමන්කළ විට වමට ඇති විජය රජදහන පාරේ (මහේන්ද්‍ර විජේරත්න මාවත), මීටර් 150ක් ගමන් කළ විට දුම්රිය මාර්ගය පසුකළ විට හමුවන වයි හන්දියෙන් දකුණට ඇති තිළිණගම පාරේ මීටර් 600ක් පමණ ඉදිරියට ගිය විට (ජල ටැංකිය පසුකරනවාත් සමගම) දකුණට ඇති පාර අවසානයේ අංක 71/1 දරන ස්ථානයේ මෙම දේපළ පිහිටා ඇත.

වැඩි විස්තර සඳහා 2019.11.15 දිනැති "දිනමිණ"හා "Daily News" පුවත්පත්වල පළ වූ වෙන්දේසි යෝජනාව සහ 2019.11.15 වැනි දින ගැසට් පත්‍රයේ පළකල වෙන්දේසි යෝජනා දැන්වීමට අවධානය යොමු කරන්න.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ, සාර්ථක ගැණුම්කරු විසින් පහත සඳහන් පරිදි මුදලින් ගෙවීම් කළ යුතු ය. :-

1. ගැනුම් මිලෙන් 10% ක්,
2. පළාත් අධිකාරියේ බදු සඳහා පළාත් අධිකාරියට 1% ක් ,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% ක්,
4. ලිපිකරු හා නිවේදකගේ ගාස්තු වශයෙන් රු. 500.00 ක්,
5. විකුණුම් වියදම් සමග කොමිස් ගාස්තු වශයෙන් එම මුදල් ද,
6. විකුණුම් සහතිකය සඳහා මුද්දර ගාස්තු,

ගැනුම් මිලෙන් 90% ක මුදල විකුණුම් දින සිට දින 30ක් ඇතුළත හයිලෙවල් පාර, නුගේගොඩ අංක 117A හි මහජන බැංකු ප්‍රාදේශීය ප්‍රධාන කාර්යාලයේ (කොළඹ පිටත) ප්‍රාදේශීය කළමනාකරු වෙත ගෙවිය යුතු ය.

දුරකථන අංක : 2768018, 2812260, 4305863

ෆැක්ස් අංකය : 2817737, 2813969

හිමිකම් ඔප්පු සහ වෙනත් අදළ විස්තර ඉහත ලිපිනයෙන් ලබාගත හැක. ඉහත සඳහන් කරන ලද පරිදි සඳහන් කළ මුදල් දින 30 ක් ඇතුලත නොගෙවුවහොත්, ගෙවා ඇති ගැනුම් මුදලින් 10%ක මුදල ආපසු නොගෙවීමට හා නැවත දේපළ විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අර්වින් පෙරේරා,
(සාම විනිසුරු) වෙන්දේසිකරු හා තක්සේරුකරු,
උසාවි කොමසාරිස් හා දිව්රුම්ලත් භාෂා පරිවර්තක.

අංක 282/3, 5/2 මට්ටම,
කිංග්ස් විව් රෙසිඩන්ස්,
කෝට්ටේ පාර, නුගේගොඩ.
දුරකථන අංක : 071-8021206

01-243

HNB 46 - 19

**හැටන් නැෂනල් බැංකුව පී.එල්.සී. - මොණරාගල ශාඛාව (කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වන වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

වැල්ලවාය ප්‍රසිද්ධ නොතාරිස් අජිත් ලියන ආරච්චි විසින් හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. හි වාසියට ලියා සහතික කරන ලද අංක 2229 සහ 2017.11.29 දින දරන බැඳුම්කරය මත අය විය යුතු මුදල් ගෙවීම ගල්බොක්ක හේවගේ ෂාන් ඉසුර සඳරුවන් කරුණාසිංහ ණයකරු ලෙස පැහැර හැර ඇති හෙයින්, එකී බැඳුම්කරයන් යටතේ අය විය යුතු ණය මුදල්, සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත සඳහන් දේපළ **වර්ෂ 2020ක්වූ ජනවාරි මස 24 වැනි දින ප. ව. 1.30 ට** එම දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

*දේපළ -* ඌව පළාතේ, මොණරාගල දිස්ත්‍රික්කයේ, බුත්තල වැදිරට කෝරළේ, මොණරාගල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය තුළ, මුප්පනේ ග්‍රාම නිලධාරි කොට්ඨාසය තුළ, මුප්පනේ ගමේ පිහිටි බකිනිකොටේවත්ත නමැති රජයේ ඉඩම් කොටසට සර්වේයර් ජනරාල්වරයා විසින් සාදන ලද අංක එෆ්. වී. පී. 172 දරන පිඹුරේ ලොට් අංක 618 වශයෙන් දැක්වෙන බෙදා වෙන් කරන ලද හෙක්ටයාර් බින්දුවයි දශම නවයයි හතයි දෙකක (හෙක්ටයාර් 0.972)ක විශාලත්වයෙන් යුත් ඉඩම සහ ඒ තුළ පිහිටි සැම සියලු දේත් වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2019.11.22 දින දරන රජයේ ගැසට් පත්‍රය හා 2019.11.25 දිනැති මව්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් බලන්න.

*ඉඩමට පිවිසීම -* හුලන්දාව හන්දියෙන් බිබිල පාරේ කිලෝ මීටර් 1 1/2ක් පමණ ගමන් කර 32/5, බෝක්කුව පසු කළ විට අදාළ දේපළට ළඟා විය හැක. අදාළ දේපළ, දකුණු අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය.-* වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. චෙක්පත් භාරගනු නොලැබේ:-

1. ගැනුම් මිලෙන් සියයට දහයක් (10%),
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකයි (1%),
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල් විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහයි (2.5%),
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තුව රුපියල් දෙදහසක්ද (රු. 2,000.00),
5. ලිපිකරුගේ හා ඝෝෂක ගාස්තු රුපියල් එක් දහස් පන්සියක් (රු.1,500.00),
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූව (90%)ක් වූ මුදල විකිණීමේ දින සිට දින 30 ක් තුළ දී හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී වෙත ගෙවිය යුතු ය. දින 30ක් තුළ දී ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට හා දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

හිමිකම් ඔප්පු හා අදාළ ලේඛන පරීක්ෂා කිරීමට සහ වැඩි විස්තර සඳහා ජ්‍යෙෂ්ඨ කළමනාකරු (ණය අධීක්ෂණ සහ අයකිරීම්), හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන :- 011-2661826, 2661835.

ජේ. ඩබ්ලිව්. ඊ. ජයවර්ධන,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 59, කුමාර මාවත, පටුවත, දොඩන්දූව,
දුරකථන : 091-2277105, 0779-663420.
ඊ මේල් - ejayawardhana77@gmail.com

01-240

---

**පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී.එල්.සී.**

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 9 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන ප්‍රසිද්ධ දේපළ වෙන්දේසිය

පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව පහත දැක්වෙන දේපළ, දේපළ පිහිටි ස්ථානයේ දී මා විසින් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

උතුරු මැද පළාතේ, පොළොන්නරුව දිස්ත්‍රික්කයේ, මැදිරිගිරිය ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ සහ ප්‍රාදේශීය සභාව තුළ සිංහල පත්තුවේ, අංක 89 - බිසෝ උයන ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ, දියසෙන්පුර ග්‍රාමයෙහි පිහිටි, සර්වේයර් ජනරාල් විසින් සපයා ඇති කැඩැස්තර සිතියම් අංක 120041 කලාප අංක 5හි කැබලි අංක 129 දරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් බිංදුවයි දශම හයයි අටයි පහයි හතරක (හෙක්ටයාර් 0.6854ක්) විශාලත්වය ඇති අංක 00260000119 පොළොන්නරුව දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ හිමිකම් සහතික පත්‍රය මත පිහිටි ඉඩම් කැබැල්ල වේ.

**වර්ෂ 2020 ක්වූ ජනවාරි මස 27 වැනි දින පෙ. ව. 11.00ට**

කඩදොර ගෙදර ලලිත් නිශාන්ත බණ්ඩාර, වෙදරාළලැ ගෙදර කුමුදුණී මැණිකේ දිසානායක සහ කොනගෙදර හීන්අම්මා යන අය "බන්ධනදායීන්" ලෙසද කොන ගෙදර හීන්අම්මා යන අය " උකස්කරු" ලෙස ද ලියාපදිංචි අංක පී. කිව්. 48 දරන පෑන් ඒෂියා බැන්කිං කෝපරේෂන් පී. එල්. සී. නමට පොළොන්නරුව හිමිකම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ හිමිකම් සහතික අංක 002600001119හි ලියාපදිංචිව ඇති 2015.09.21 දිනැති 2395, 2017.07.31 දිනැති අංක 3075 සහ 2018.08.03 දිනැති අංක 3457 දරන උකස් සාධන පත්‍රයන් මත ලැබිය යුතු මුදල් ගෙවීම පැහැර හැර ඇති හෙයින් ද,

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා වර්ෂ 2019.10.04 වැනි දිනැති රජයේ ගැසට් පත්‍රය ද, වර්ෂ 2019.12.06 දිනැති දිවයින, දි අයිලන්ඩ් පුවත්පත් ද සහ වර්ෂ 2019.12.09 දිනැති තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*දේපළට පිවිසෙන මාර්ගය* - මැදිරිගිරිය කඩවීදියේ සිට කිලෝමීටර් 5.5ක් දියසෙන්පුර කඩවීදිය දක්වා පැමිණ වමට ඇති බිසෝ උයන පාරට හැරී තවදුරටත් මීටර් 300ක් පමණ යන විට විෂයගත දේපළ හමුවේ.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසාන වූ විගස ගැණුම්කරු එවෙලේම පහත සඳහන් මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය. :-

1. ගැණුම් මිලෙන් 10% (සියයට දහයක්),
2. පළාත් පාලන ආයතන ගාස්තු වශයෙන් 1%ද (සියයට එකයි) සහ වැට් බද්ද ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල වශයෙන් විකුණුම් මිලෙන් 2 1/2% (සියයට දෙකහමාරක්),
4. ප්‍රචාරක වියදම් ද,
5. ලිපිකරුගේ හා සෝෂකගේ ගාස්තුව රු. 1,500.00 ද,
6. විකුණුම් කොන්දේසි සඳහා නොතාරිස් ගාස්තු රු. 3,000.00 ද,

වෙන්දේසි දිනයේ සිට වැඩ කරන දින 30ක් ඇතුළත ගැණුම් මිලේ පරිශේෂය වන 90%ක මුදල බැංකුවට ගෙවිය යුතු ය. එකී 90% ඉතිරි මුදල දින 30ක් ඇතුළත දී නොගෙවුවහොත් ගෙවා ඇති 10%ක මුදල අහිමි කිරීමට හා එකී දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා අනෙකුත් ලියවිලි පරීක්ෂා කිරීම සහ වෙනත් අදාළ තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු - නීති, පෑන් ඒෂියා බැංකින් කෝපරේෂන් පී. එල්. සී., ප්‍රධාන කාර්යාලය, අංක 450, ගාලු පාර, කොළඹ 03.

දුරකථන අංක : 011- 4667245/ 0114667227.

අයි. ඩබ්ලිව්. ජයසූරිය,
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
සහ බලයලත් වෙන්දේසිකරු.

අංක 369/1, දුටුගැමුණු මාවත,
මාවිල්මඩ, මහනුවර,
දුරකථන අංක : 0718446374, 0777761706
ෆැක්ස් : 08112210595.

01-253

HNB 281 - 18 (1)

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. පදවි පරාක්‍රමපුර ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපලක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

කුරුණෑගල ප්‍රසිද්ධ නොතාරිස් එස්. බී. වඳුරාගල විසින් සහතික කරන ලද්දා වූ ද (හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2013 ජූලි 29 දින සහතික කළ අංක 18571 සහ 2014 ඔක්තෝබර් 31 වැනි දින සහතික කළ අංක 19779 දරන උකස් බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම වික්‍රම ආරච්චිගේ රුවන් කුමාර හෙවත් වික්‍රම ආරච්චිලාගේ රුවන් කුමාර වික්‍රමාරච්චි යන අය ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ **2020 ක්වූ ජනවාරි මස 24 වැනි දින පෙ. ව. 10.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**ඉහත සඳහන් කළ පළමු උපලේඛනය**

වයඹ පළාතේ, කුරුණෑගල දිස්ත්‍රික්කයේ, දඹදෙනි හත්පත්තුවේ, උඩපොල ඕතොට කෝරලයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, පොල්ගහවෙල ප්‍රාදේශීය සභා සීමාව තුළ දකුණු පොල්ගහවෙල අංක 9398 ග්‍රාමනිලධාරී වසමේ ගලබඩගම, කහදිවල හි පිහිටි ගලහිටියාවේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් විසින් 2007 ජනවාරි 14 දින පිළියෙළ කරන ලද අංක 3839ඒ දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01.03 සහ 04 වශයෙන් දැක්වෙන ඉඩම රූඩ් එකයි පර්චස් දහඅටයි දශම අටක (අ.0, රූ.1, පර්.18.8) විශාලත්වයෙන් වූ ඉඩම සමග ගොඩනැගිලි, වගාවන් සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ. (එකී අංක 3839 - ඒ දරන පිඹුරේ ලොට් 05 සහ 02, අංක 3839ඒ දරන පිඹුරේ ලොට් 12 වශයෙන් දැක්වෙන මාර්ගයේ එහා මෙහා ගමන් කිරීමේ මාර්ග අයිතිය සමග)

ඉහත සඳහන් පසුව ඒකාබද්ධ කරන ලද ගලබඩගම, කාදිවෙල හි පිහිටි ගලහිටියාවේ වත්ත නමැති ඉඩමට බලයලත් මිනින්දෝරු එච්. එම්. එස්. හේරත් විසින් 2013 ජූලි 13 දින පිළියෙළ කරන ලද අංක 9774 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් 01 - ඒ වශයෙන් දැක්වෙන ඉඩම රූඩ් එකයි පර්චස් දහඅටයි දශම අටක (අ.0, රූ.1, පර්.18.8) විශාලත්වයෙන් යුක්ත වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.06.14 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2018.06.19 දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම* - පොල්ගහවෙල නගරයේ සිට (දුම්රිය ස්ථානය), කෑගල්ල පාරේ, මීටර් 150ක් පමණ ගමන් කර, හරියටම මහජන බැංකු ශාඛාවට මෙපිටින් ඇති තාර දමා ඇති පාරට මීටර් 50ක් පමණ ඉදිරියට ගොස්, අඩි 12ක් පළල මාර්ග රක්ෂිතයට වමට හැරී මීටර් 30ක් පමණ ගමන් කළ විට දේපළට ළඟා විය හැකිය. එය පාරේ කෙළවරේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.:-

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් ද (2.5%),
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000.00) ක් ද,
5. ලිපිකරුගේ හා සෝෂක ගාස්තුව රුපියල් පන්සියයක් (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක් (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෝෂ්ඨ කළමනාකරුः (ණය අධීක්‍ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661866, 2661828 ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 56,
අතිපූජ්‍ය මඩිහේ නාහිමි මාවත,
මහරගම.
දුරකතන අංක : 0777-378441/ 0714-424478
ෆැක්ස් - 0112-509442.

01-185

---

HNB 281 - 28 (2)

**හැටන් නැෂනල් බැනක් පී.එල්.සී. පදවි පරාක්‍රමපුර ශාඛාව**

(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

අනුරාධපුර ප්‍රසිද්ධ නොතාරිස් යූ. විජේරත්න විසින් සහතික කරන ලද්දාවූ ද (හැටන් නැෂනල් බැන්ක් පී. ඒ. සී. නමට ලියන ලද්දා වූ

ද, 2013 ජූලි 03 දින සහතික කළ අංක 1774 සහ 2014 නොවැම්බර් 05 වැනි දින සහතික කළ අංක 2469 දරන උකස් බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම වික්‍රම ආරච්චිගේ රුවන් කුමාර හෙවත් වික්‍රම ආරච්චිලාගේ රුවන් කුමාර වික්‍රමාරච්චි යන අය ණයකරු වශයෙන් පැහැර හැර ඇති හෙයින් ද, හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවීම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුලුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ **2020 ක්වූ ජනවාරි මස 23 වැනි දින ප. ව. 3.00ට එම දේපළ පිහිටි ස්ථානයේ දී** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.)

**ඉහත සඳහන් කළ පළමු උපලේඛනය**

උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාතේ, නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කණ්දරා කෝරලේ, අංක 240 ග්‍රාමනිලධාරී වසමේ, ආත්තිකුලම ගමෙ හි පිහිටි ඉඩමෙන් බෙදාවෙන් කරන ලද ඉඩම ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ.0, රූ.1, පර්.0) විශාලත්වයෙන් වූ ඉඩම සමග එහි පිහිටි සියලු දේත් සමග වේ.

වඩාත් මෑතකදී කරන ලද මැනීමකින් පසු මෙම ඉඩම පහත සඳහන් පරිදි විස්තර වේ.

උතුරුමැද පළාතේ, අනුරාධපුර දිස්ත්‍රික්කයේ, නුවරගම් පළාතේ, නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කණ්දරා කෝරළේ, අංක 240 ග්‍රාමනිලධාරී වසමේ, ආත්තිකුලම ගමෙ හි පිහිටි විජය මාවතේ, වරිපනම් අංක 21/82 දරන ඉඩමට නොතාරිස් ආර්. බී. අබේසිංහ විසින් ලියා සහතික කරන ලද අංක 841 ඔප්පුවට බලයලත් මිනින්දෝරු ජේ. ටී. ගලගෙදර විසින් 2008 පෙබරවාරි 07 දින පිළියෙළ කරන ලද අංක 2033 දරන පිඹුරෙන් බෙදාවෙන් කරන ලද ලොට් 1 වශයෙන් දැක්වෙන ඉඩම ප්‍රමාණයෙන් රූඩ් එකක් (අ.0, රූ.1, පර්.0) හෙවත් හෙක්ටයාර් බිංදුවයි දශම එකයි බිංදුවයි එකයි එකක් (හෙක්ටයාර් 0.1011) විශාලත්වයෙන් යුක්ත වූ ඉඩම සමග ගොඩනැගිලි, ගහකොළ, වගාවන් සහ එහි පිහිටි සියලු දේත් සමග වේ.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.06.14 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2018.06.19 දින ලක්බිම, ඩේලි මිරර් සහ තිනක්කුරල් පුවත්පත් ද බලන්න.

ඉඩමට පිවිසීම - අනුරාධපුර බැංකු ටවුමේ සිට හරිශ්චන්ද්‍ර මාවතේ, කිලෝමීටර් 1.50ක් පමණ රෝහල් මංසන්ධිය දක්වා ගොස් බණ්ඩාරනායක මාවතට වමට හැරී බණ්ඩාරනායක මාවත දිගේ ගුවන් තොටුපළ හන්දිය දක්වා කිලෝමීටර් 1.5ක් පමණ ගොස් එතැනින් වමට හැරී කිලෝමීටර් 1.25ක් නුගේ හන්දිය දක්වා ගමන් කර ඉන් වමට හැරී මීටර් 300ක් පමණ ඉදිරියට ගොස්, හමුවන තුන්මං සන්දියෙන් දකුණට ගුරු පාරට හැරී මීටර් 200ක් ගිය විට හමුවන ගුරු පාරට වමට හැරී තවත් මීටර් 75 ක් ගිය විට දේපළට ළඟා විය හැකිය. අදාළ දේපළ විජය මාවතේ, වරිපනම් අංක 21/85 වශයෙන් දකුණු අත පැත්තේ හමුවේ.

ප්‍රසිද්ධ පාරේ සිට මෙම දේපළට අඩි 20ක් පළල රථවාහනයකින් යා හැකි සෘජු ප්‍රවේශයක් ඇත.

ගෙවීමේ ක්‍රමය.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු ය.:-

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ කොමිස් මුදල විකුණුම් මුදලින් සියයට දෙකයි දශම පහක් ද (2.5%),
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000.00) ක් ද,
5. ලිපිකරුගේ හා සෝෂක ගාස්තුව රුපියල් පන්සියයක් (රු. 500) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනුවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමනාකරු: (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී., අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661866, 2661828 ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු හා
බලයලත් වෙන්දේසිකරු.

අංක 56, අතිපූජ්‍ය මඩිහේ නාහිමි මාවත,
මහරගම.
දුරකථන අංක : 0777-378441/ 0714-424478
ෆැක්ස් - 0112-509442.

01-186

---

HNB 292 - 18.

**හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. දෙණියාය ශාඛාව**
(කලින් සීමාසහිත හැටන් නැෂනල් බැංකුව ලෙස හඳුන්වනු ලැබූ)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ 4 වැනි වගන්තිය යටතේ පවත්වනු ලබන අගනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

මොරවක ප්‍රසිද්ධ නොතාරිස් ඩී. ඩී. අබේවික්‍රම විසින් සහතික කරන ලද්දා වූ හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. නමට ලියන ලද්දා වූ ද 2013 ජූලි මස 24 වැනි දින සහතික කළ අංක 2726 සහ 2014 නොවැම්බර් 27 වැනි දින සහතික කළ අංක 3231 දරන බැඳුම්කරයන් යටතේ අය විය යුතු මුදල් ගෙවීම වික්‍රමසිංහ ගුණසේකර අජිත් සරත් කුමාර සහ තම්මිටිය ගොඩගේ කුසුමාවතී යන අය ණයකරුවන් ලෙස පැහැර හැර ඇති හෙයින් ද, හැටන්

නැෂනල් බැන්ක් පී. එල්. සී. විසින් මා වෙත පවරා ඇති බලතල අනුව අයවිය යුතු ණය මුදල් සියලු ස්ථාපිත ගෙවම් හා වෙන්දේසිකරුගේ ගාස්තු ඇතුළුව සියලුම මුදල් අයකර ගැනීම පිණිස පහත සඳහන් දේපළ **2020 ක්වූ ජනවාරි මස 28 වැනි දින පෙ. ව. 10.30ට එම දේපළ පිහිටි ස්ථානයේ දී** ප්‍රසිද්ධ වෙන්දේසියේ විකුණනු ලැබේ.

**උපලේඛනය**

දකුණු පළාතේ, මාතර දිස්ත්‍රික්කයේ, මොරවක් කෝරළේ, කොටපොල ප්‍රාදේශීය සභා සීමාව තුළ සහ කොටපොල ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, උසමලගොඩ ග්‍රාම නිලධාරි වසමේ, කොටපොල හි පිහිටි එගොඩවත්තහේන නමැති ඉඩමට සර්වේයර් ජෙනරාල් විසින් 1917 ජුනි 28 වැනි දින මැන සාදන ලද අංක 325752 (B. S. Sup.Sheet 0 10/5058/F. B. No. 23960) දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ලොට් අංක 127 වශයෙන් දැක්වෙන ඉඩම් කොටස ප්‍රමාණයෙන් අක්කර හයයි රූඩ් තුනයි පර්චස් දහඅටක (අ.6, රූ.3, පර්.18) විශාලත්වයෙන් වූ ඉඩම සමග පස සහ එහි පිහිටි සියලුම දේත් සමග වේ.

බලයලත් මිනින්දෝරු ඒ. ජේ. ජයසේකර විසින් 2013 අප්‍රේල් මස 30 දින සාදන ලද අංක 87/2013 දරන පිඹුරෙන් බෙදා වෙන් කරන ලද ඉහත සඳහන් ඉඩම් කොටස නැවත මැන දක්වා ඇත.

යෝජනා සම්මුතිය පිළිබඳ නිවේදනය සඳහා 2018.08.24 වැනි දින රජයේ ගැසට් පත්‍රය හා 2018.09.04 දින ලක්බිම,තිනක්කුරල් සහ ඩේලි මිරර් පුවත්පත් ද බලන්න.

*ඉඩමට පිවිසීම* - අකුරැස්ස දෙනියාය පාරේ කි. මී. 1/2ක් පමණ කොටපොල හන්දිය දක්වා බෝදෙනිය පාර තෙක් ගමන් කරන්න. එතැනින් මෙම පාරේ තවත් කිලෝමීටරයක් පමණ ගමන් කරන්න. අදාළ දේපළ එම පාරේ වම් අත පැත්තේ පිහිටා ඇත.

*ගෙවීමේ ක්‍රමය*.- වෙන්දේසිය අවසානයේ උපරිම ලංසු තබන්නා විසින් පහත සඳහන් පරිදි මුදල් වෙන්දේසිකරුට ගෙවිය යුතු යః-

1. ගැණුම් මිලෙන් සියයට දහයක් (10%) ද,
2. ප්‍රාදේශීය සභා බදු සඳහා සියයට එකක් (1%) ක් ද,
3. වෙන්දේසිකරුගේ වෘත්තීමය ගාස්තු,
4. විකුණුම් කොන්දේසි සහතික කිරීමේ නොතාරිස් ගාස්තු රුපියල් දෙදහස (රු. 2,000.00) ක් ද,
5. ලිපිකරුගේ හා සෝෂක ගාස්තුව රුපියල් දහසක් (රු. 1000) ක් ද,
6. සියලුම ප්‍රචාරක වියදම් ද වේ.

ගැණුම් මුදලින් ඉතිරි සියයට අනූවක් (90%) වූ මුදල විකිණීමේ දින සිට දින 30ක් ඇතුළත හැටන් නැෂනල් බැන්ක් පී. එල්. සී. වෙත ගෙවිය යුතු ය. දින 30ක් ඇතුළත ඉතිරි මුදල නොගෙවුවහොත් ගෙවා ඇති සියයට දහයක (10%) මුදල අහිමි කිරීමට සහ දේපළ නැවත විකිණීමට බැංකුවට අයිතිය ඇත.

අදාළ ඔප්පු හා ලියවිලි පරීක්ෂාව සහ වෙනත් තොරතුරු ජ්‍යෙෂ්ඨ කළමණාකරු: (ණය අධීක්ෂණ සහ අයකිරීම්) හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී. අංක 479, ටී. බී. ජයා මාවත, කොළඹ 10.

දුරකථන අංක : 2661866, 2661828 ගෙන් ලබා ගත හැක.

පියරත්න මුතුකුමාරණ,
(මුළු දිවයිනටම සාම විනිසුරු)
උසාවි කොමසාරිස්, තක්සේරුකරු
හා බලයලත් වෙන්දේසිකරු.

අංක 56,
අතිපූජ්‍ය මඩිහේ නා හිමි මාවත, මහරගම.
දුරකතන අංක : 0777-378441/ 0714-424478
ෆැක්ස් - 0112-509442.

01-187

---

**ඩී එෆ් සී සී බැංකුව පී එල් සී**
(කලින් ඩී එෆ් සී සී වර්ධන බැංකුව පී. එල්. සී. හි අනුප්‍රාප්තික)

1990 අංක 04 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතෙහි 9 වන වගන්තිය යටතේ වටිනා දේපළක් ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීම

